# DALADÁPUJÁWALIYA.

PUBLISHED BY

**K. M. PERERA.**

# දලදාපූජාවලිය.

සමණ සාමීන්වහන්සේනමක් ලවා
ලේඛකදෝෂාපහරණයෙන් ශුද්ධකරවාගෙණ
වැල්ලවත්තේ පදිංචි
**කේ. ඇම්. ප්‍රේර වන මා විසින්**
බැන්ඩියවත්තේ
**විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි**
මුද්‍රාඞ්කණයකරවනලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 2435.

*Printed at the "Vidyasagara" Press,*
*Brandiyawatte.*

1893.

WICK'S BOOK DEPOT
MARADANA

# සංඥාපනය.

දළදාපූජාවලියනම් මෙම මාහැඟි ධර්මප්‍රකරණය ප්‍රධානවශයෙන් සර්වඥ දාඨාධාතූන්වහන්සේට කරණලද පූජාපිළිබඳ කරුණුමිශ්‍ර සිංහලභාෂාවෙන් ගලපාකරණලද්දකි. මෙය අසවල්කාලයෙහි අසවල්පණ්ඩිතයෙක් විසින් ගලපනලද්දකකියා නිශ්චයකොට දක්වීමටද කරුණු නොපැණේ. එසේදවුවත් මෙය දාඨාවංශයට මැතභාගයෙහි ධර්මශාස්ත්‍රාදියෙහි නිපුණවූ එක්තරා පණ්ඩිතයෙක්විසින් කරණලද්දක්වාට අනුමානනැත. ඊට මැතභාගයෙහිබැවි මෙහි අතරතුරේ තිබෙණ දාඨාවංශයෙහි ප්‍රකාශ ගාථාවලින් හැඟේ. මෙහිගිහිපැවිදි සැමදෙනාගේ දැනගැණීමට සෑහෙන විශෙෂසෞගත චරිතරාසියක් අන්තර්ගතයි. එනම් පළමුකොට විජය රජහුගේ සංක්‍ෂෙප ප්‍රවෘත්තිකථාවද අපමහ බෝසතාණන් වහන්සේගේ මනොප්‍රණිධානයෙහි පටන් තුසීපුරයෙහි ඉපදීමදක්වාඇති බොධිසත්ව චරිතයද එයින්චුතව කිඹුල්වත්පුරනුවර ශාක්‍යරජකුලයෙහි ඉපද මහාභිනිෂ්ක්‍රමනාදිය කොට බුද්ධත්වයට පැමිණවදාරා ධර්මචක්‍රය පැවැත්වීමආදී විභාගහා අපබුදුන් ලක්දිව්වැඩිනමන්ආදිය පටන් පරිනිර්වාණයදක්වා ඇති ප්‍රවෘත්තියද එතැන්පටන්අවසානයදක්වා දන්තධාතූන්වහන්සේගේ ප්‍රවෘත්තිකථාවදයන විශිෂ්ට සම්බුද්ධ චරිතරාසියක් ප්‍රකාශවනබැවි වැඩි දුරටත් සැලකියයුතුයි. තවද දන්තධාතූන්වහන්සේගේ ප්‍රවෘත්තියදැන ගැණීමට දාඨාවංශයතිබෙන නමුත් එයශබ්දශාස්ත්‍රාදිය නොදත්ජනයාගේ දැනගැණීමට පහසුනොවේ. මේවනාහි එවැනිජනයාගේ දැනගැණීමටද පහසුපරිද්දෙන් බාලදරුවන්ටපවා තේරෙනලෙස ලිහිල්කොට ගලපනලද්දක් බැවින් ඒසියළු තත්වවිජානනයෙහි තත්පරවූවන්ට අත්‍යන්තොපකාරීවේ. එසේම මෙහි දාඨාවංශ අනුගතවම වාසගම්යෙදීමේ ඉතා පැහැදිලි මධුරකොමලත්වයක්ද විද්‍යමානයි. එබැවින් මෙය සියළු බෞද්ධයන්විසින්ම සමාදරයෙන් පිළිගෙණ භාවිතාකිරීමෙන් දළදා පිදීමාදියෙහි නියුක්ත වීමෙන් සගමොක්සැප සිද්ධකටයුතු.

මේ පොත රටේ සොයාගැණීම දුස්කර බැවින් පොත් දෙකක් පමණ සොයාගෙණ මෙය ලෝකයාට සුලභකරදෙන අදහසින් සමර්ථ සාමීන් වහන්සේනමක් ලවා හැකිපමණින් සුද්ධකරවාගෙණ මෙසේ අච්චුගැස්වූ බව දතයුතු. මෙහි අපේ යම්කිසි ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත දොස් ඇතත් එය ප්‍රාඥයෝ සමාධිය භජනය කිරීමෙන් විසොධනය කෙරෙත්වා.

තවද, මේ පොත නැවත අච්චුගැස්වීමේ අයිතිවාසිකමද මෙහි නාම ජේනා මටම භාරගත්බව දැනගත යුතු.

මේවගට,

වැල්ලවත්තේ පදිංචි

කේ. ඇම්. පේරා.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 33 | අභිලාස | අභිලාෂ |
| 3 | 2 | සාවක | යාචක |
| ,, | 36 | සිව්වනක් | සිව්වණක් |
| 6 | 27 | සතොනාස | සතොනාෂ |
| 7 | 25 | වෙස | වෙශ |
| 8 | 9 | මානිකාය | මාණීකාය |
| ,, | 15 | සුවිසුද්ධ | සුවිශුද්ධ |
| 9 | 15 | පානි | පාණි |
| ,, | 16 | පිරිමැඩ | පිරිමැද |
| ,, | 28 | පලගක් | පළගක් |
| 13 | 23 | සජිජිත | සජ්ජිත |
| 14 | 7 | නාරයනාදිවූ | නාරයණාදිවූ |
| ,, | 12 | පැලලුප් | පැළලුප් |
| 16 | 4 | සබ්ද | ශබ්ද |
| ,, | 13 | ප්‍රශිද්ධ | ප්‍රසිද්ධ |
| ,, | 14 | නාරයනාදිවූ | නාරයණාදිවූ |
| ,, | 18 | අලකල්හි | අළකල්හි |
| ,, | 27 | රෙනු | රෙණු |
| 17 | 17 | නාරයන | නාරයණ |
| ,, | 21 | නාරයන | නාරයණ |
| 18 | 18 | කරණ්නාවූ | කරන්නාවූ |
| ,, | ,, | සෙනාහයෙන් | ස්නෙහයෙන් |
| 19 | 4 | ප්‍රශිද්ධව | ප්‍රසිද්ධව |
| ,, | 18 | ප්‍රශිද්ධව | ප්‍රසිද්ධව |
| 20 | 24 | සබ්ද | ශබ්ද |
| 24 | 24 | චරිතො | චරිතො |
| 25 | 20 | අචලශුද්ධා | අචලශ්‍රද්ධා |
| 26 | 35 | නිලිපුල් | නිළුපුල් |
| 27 | 2 | නමනවූ | නමනවූ |
| ,, | 33 | පත්ථයනොනා | පත්ථයනොතා |
| 29 | 16 | ධතුකරඬුව | ධාතුකරඬුව |

# දළදා පූජාවලිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

සම්බුද්ධං සුඛිදං සෙට්ඨං ඤෙය්‍යසාගරපාරගුං,
වන්‍දෙ තං සිරසා නිච්චං නරාමරසමච්චිතං.

මුනින්‍දප්පභවං තොයා සුජනෙහි සුසෙවිතං,
මොහස්සද්ධංසකං සෙට්ඨං වන්‍දෙ පාවචනුත්තමං.

නිරඞ්ගණං ගණංචාපි පුඤ්ඤක්ඛෙත්තමනුත්තරං,
ගුණප්පදං මහග්ඝං තං වන්‍දෙහං සුගතත්‍රජං. [a]

---

යස්මා දසෙත්වා මුනයො ඉමස්මිං
විස්සුතනයා'වාසමකංසු පුබ්බෙ,
ධම්මට්ඨිතානංච නරාධිපානං
වංසො පවත්තිස්සති සීහළස්මිං.

මුනයො, මුනීහු; (හෙවත් අගාරිකමුනි, අනාගාරිකමුනි, සෙඛමුනි, අසෙඛමුනි, පච්චෙකමුනි සංඛ්‍යාත පඤ්චවිධ මුනීන්ට මුනිශ්වරවූ සර්වඥ මුනීහු) පුබ්බෙ, පූර්වකාලයෙහි; ඉමස්මිං සීහළස්මිං, මේ සිංහලද්වීපයෙහි (හෙවත් අප බුදුන් බුදුවීමට පළමු කොට ජම්බුද්වීපයෙහි කාලිඟු රට කාලිඞ්ගචක්‍රවර්ති රජහුගේ රාජවංශය නොහැර ආ);—

වංගරජ්ජස්ස යං ධීතා අරඤ්ඤෙ වනගොචරා,
සීහසංවාසමන්වාය අලත්ථ චෙව දාරකෙ.
අතික්කන්ත සොළස වස්සො නික්ඛමිත්වා ගහන්තරා,
මාපෙසි නගරං තත්ථ සීහපුර වරුත්තමං.

මෙසේ වඞ්ගුරට වඞ්ගුරජහුගේ ධීතෘවක් පේරිචාරිව ගොස් ලාඩදේශයෙහි සිංහයකුහා සංවාසව ලබනලද රජකුමරෙක් අතික්‍රාන්ත ෂොඩශ වර්‍ෂ ඇතිව එහිම සිංහනාම් පුරයක් කරවා වසනුයේ—

---

a මේ ගාථා තුණ අමුතුවෙන් ප්‍රබන්ධකරණලදි.

ද්වත්තිංසභාතරො හොන්ති සීහපුත්තස්ස අත්‍රජා,
විජයස්ස සමායෙව සෙසා කනිට්ඨභාතරො.

මෙසේ වාසයකරන්නාවූ ඒ සීහබාහුනම් නරෙන්ද්‍රයාගේ අභිජාත පුත්‍රවූ දෙතිස් රජකුමරුවන් අතුරෙන් ප්‍රධාන පුත්‍රවූ පවිත්‍රචාරිත්‍ර විචිත්‍ර ගුණ ඇති විජයනම් රජකුමරුවෙක් වී.

පරිනිබ්බාණසමයෙ සම්බුද්ධො දීපදුත්තමො,
සීහබාහුස්ස යං පුත්තො විජයො නාම ඛත්තියො.

ලංකාදීපං අනුප්පත්තො හිත්වා ජම්බුසිරිව්හයං,
ව්‍යාකාසි බුද්ධසෙට්ඨො සො රාජා හොහී'ති ඛත්තියො.

අප බුදුන් පිරිනිවන්පානා දවස් සිංහබාහුරජහු පිත් විජයනම් රජ කුමරුවෙක් ජම්බුද්වීපය හැර ලක්දිව් බැස රජකරන්නේයයි බුදුන් විසින් විදාරණලද–

ස්වස්ති ශ්‍රී නවරත්න ශ්‍රී විරාජිත ලඞ්කාතල රාජ්‍යධුරන්ධර රත්නත්‍රය පරිපාලන මූර්ධාභිෂික්ත මණිමකුට මෞලිමාලා'ලඞ්කෘත ගුණගණා'භරණවිභූෂිත ත්‍රිසිංහලෛකච්ඡත්‍ර භුවනහිතකර භුවනෛකබාහු මනුසා සිත රාජධුරන්ධර පරශත්‍රු විකල විලොපනිවාරණ සන්ධිසන්ධානකර සෙනාන්තරාමාත්‍ය අලගක්කොනාරජයසිංහප්‍රතිරාජසම්රිනනාම ප්‍රසිද්ධ අග්‍රාමාත්‍යයන් තුන්දෙනාහට සඤ්ජනිත පුණ්‍යසම්භාර ප්‍රධාන කොට කියනුය–සධර්මීශ්වර චක්‍රවර්තීවූ ධර්මරාජන්වූ දශබලධාරීවූ ත්‍රෛලොක්‍ය ස්වාමීවූ අනන්‍ය සාධාරණවූ ද්වාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණාශීත්‍යානු ව්‍යඤ්ජන ව්‍යාමප්‍රභාකෙතුමාලා'ලඞ්කාරයෙන් විරාජමානවූ අප බුදු රජානන්වහන්සේ සර්වඥතාඥාන ප්‍රතිලාභයට පූර්වාරම්භ කොට සංසාරයෙහි සැරිසරා ඇවිදිනාසේක් යටගියදවස බ්‍රහ්මදෙවනම් බුදුකෙණෙකුන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහිදී පටන් මම බුදුවෙම්යි යන මනොප්‍රණිධානය කොට එතැන්පටන් ශතාසංඛෙය්‍ය කල්පලක්ෂයක් මනොවීර්යයි කොට ගෞතමනම් සර්වඥකෙණෙකුන්වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි පටන් බුදුවෙම්වයි කියා නවාසංඛ්‍ය කල්පලක්ෂයක් වාක්භෙද ප්‍රාර්ථණා කොට එතැන් පටන් මේ භද්‍රකල්පයට සාරාසංඛ්‍යකල්පලක්ෂයකින් යටගියදවස ලොකයෙහි පහලවූ තුන්ලොවට අසහාය ප්‍රදීපයක් වැනිවූ දීපඞ්කරනම් සර්වඥරාජොත්තමයානන්වහන්සේගේ බුද්ධරාජ්‍යයෙහි අපමහබෝසතානෝ අමරවතිනම් නුවර බමුණුමහසල්කුලයෙහි සුමෙධනම් බ්‍රාහ්මණකුමාරව ඉපිද වැඩිවියපැමිණ පඤ්චකාමානුභවයෙහි කලකිරී ප්‍රව්‍රජ්‍යාවෙහි අභිලාස ඇතිව එකල රජකරණ රජ්ජුරුවන් කරා ගොස් ස්වාමිනි මාගේ සත්වනකුලපරම්පරාවෙන් අනුවපැවත ආවාවූ මේ ධනරාශිය දානමුඛයෙහි විසර්ජනයකරණු කැමැත්තෙමියි ඒ රජහට දන්වූකල්හි යහපත සගයානනි තොපි තොපගේ අභිප්‍රානු

තුලවූ පරිද්දෙන් කරවති අවසර දුන්කල්හි–නුවර මුළුල්ලෙහි බෙරපියවි
කරවා භෙරීනාද නමැති සුගන්ධයෙන් ආ යාචක නමැති භෘඞ්ගශ්‍රෙණීන්
දනනැමැති මුවරද සමූහයෙන් පිණවා හිමාලයවන ප්‍රදෙශාභිමුඛව ධාර්
මිකනම්වූ පර්වතශ්‍රායෙහි සක්දෙව්රජහුගේ නියොග ලත් විශ්වකර්‍මදිව්‍ය
පුත්‍රයා විසින් අඳුන්දිවිසම් වාකචීරාදීන් සහිත කොට මවාතිබූ පර්‍ණ
ශාලාව දක එහි තුබූ පිරිකරද ගෙණ තාපසවෙසය ධරා එහි සත්තු
භවව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආකාශචාරීව ඇවිදිමින් දව
සෙක්හි දීපඞ්කරනම් සර්‍වඥරාජොත්තමයානන්වහන්සේ සාරලක්‍ෂයක්
ක්‍ෂීණාශ්‍රවයන්වහන්සේ පිරිවරා ගම් නියම්ගම් රාජධානි ආදිවූ ස්ථාන
යන්හි බුඞ්ශ්‍රීනමැති චන්ද්‍රයා උදකරවා වෛනෙජනනමැති කෞමුද
ප්‍රබොධකරවමින් ක්‍රමයෙන් රම්‍යනම්වූ රඹගම්නුවර වැස්සන්විසින් ආරා
ධිතවූ බුදුරජානන්වහන්සේ වඩනාවූ මාර්‍ගය සරහා පිළියෙළකරන්නාවූ
දිනයෙහි සන්ධ්‍යා වලාගෙකින් නිකුත් රත්විදුලියක් සේ ආකාශයෙන්
ඒ මාර්‍ගය පිළියෙළකරන්නාවූ ජනසමූහයා මධ්‍යයට පැමිණ පින්වත්වූ
ජනයෙනි කව්රුන් වඩනා මගක් සරහව්දැයි විචාළ ඇයි සුමෙධතාපස
යන්වහන්ස තව නුඹවහන්සේ නොදන්නාසේක්ද දීපඞ්කර සර්‍වඥයන්
වහන්සේ අපගේ නුවරට වඩාගෙණ යනුපිණිස මගසරහම්යයි කී ජන
සමූහයාගේ බස් අසමින් චක්‍රවර්ති රජක්හුගේ කණතුබූ රුවන් තෝඩු
වක් ගිලිහී භූමියෙහි පතිනවන්නාක් මෙන් භූමියට වැඩ එසේවූ උත්ත
මයානන්වහන්සේ වඩනා මගක් සරහව්නම් මටත් ඉන් ස්ථානයක්
දෙවයි ඉල්වූකල්හි ඔවුන් විසින් තමන්ට නැතිමට උගහටව තිබූ කඳු
රැළියක් දුන්කල්හි මහබොධිසත්වයෝ සිතන්නාහු මාගේ ශරීරයෙහි
ලෝමකූපමාත්‍රයකටත් ආයාසයක් නොකොට සත්රුවන්වැලි ගෙණ
වුත් පුරවන්නමුදු පරසතු මදාරා ගෙණවුත් පුරවන්නමුදු ආයාසයක්
නොවම කෙරෙම්මයයි යනාදීන් සිතා වසවර්තිමාරයාඇස වැලිගසන්
නාසේ තමන්ගේ කායශක්තියෙන් පාංශු ඇද ඒකඳුරැළිය පුරවමින්
සිටිකල්හි–නරාමරසහිතවූ සාරලක්‍ෂයක් ක්‍ෂීණාශ්‍රවයන්වහන්සේ පිරිවරා
නීලපීතලොහිතාවදාතාදී සවර්‍ණක් ෂඩ්වර්‍ණබුඞ්ධරශ්මිමාලාවන් ඒඒ දිගාන්
තරයෙහි විහිදුවමින් සුපිෂ්පිත කර්ණිකාර තරුශිඛරසමුද්ගත විලාසශ්‍රී
මුළුලෝවැස්සන්ට පාමින් වඩනාවූ සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීවිලාස දක්
වමින් අඩාලවූ කර්මාන්ත ඇති කඳුරැළිය පිට වාකචීරාදීන් අතුට
ජටා.. මූද, බුදුන්වඩනාවූ දශාවට හිසලා බුදුන් ප්‍රධානකොටඇති සාර
ලක්‍ෂයක් රහතුන්වහන්සේ පය කලල් නොපාගා මාගේ පිටමැඩගෙණ
වඩනාසේක්නම් යෙහෙකැයිසිතා ඒ මහබොධිසත්වයෝ රත්නෙයක්
මෙන් වැදහොත්කල්හි හිස්දෛරදසාවෙහි වැඩසිට මේකෙසේවූ පුරුෂ
යෙක් දෝහෝයි බලාවදාරා කැවිච එන සිව්වනක් පඹිදට වදාරණ බුදු
රජානන්වහන්සේ–

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං,
අපරිමෙය්‍යෙ ඉතොකප්පෙ අයං බුද්ධො භවිස්සති.

යනාදීන් එබඳු මහණෙනි උග්‍රවූ තපොතෙජස් ඇත්තාවූ මේ තාපසයන් බලව සාරසංඛෙය්‍ය කල්පලක්ෂයකින් මත්තෙහි මාගේම බුදුව සියලු සත්වයන් සංසාර නමැති සාගරයෙන් ගොඩනගා ශාන්තවූ නිර්වාණ දශකවන්නේයයි මතු උපදනා නුවරද මව්පිය දෙදෙනාද පුත්‍රකලත්‍රවාහණබොධිවජ්‍රාශනඅග්‍රශ්‍රාවකාදීවූ විශෙෂද ප්‍රකාශ කොට මේ සත්ව තෙමේ මතු ගෞතමනම් බුදුවෙයි යනාදීන් විවරණ දීවදූර තුන්වරක් පැදකුණු කොට මල් අටමිටක් පූජා කොට නික්මුනු කල්හි පස්සෙහි වඩනා සාරලක්ෂයක් රහතුන්වහන්සේත් එපරිද්දෙන්ම වෙනවෙනම පූජා කලසේක. එතැන්හි රැස්වූ දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණාදී සියලු ලෝවැසියන් විසින් පුදනලද පුෂ්පරාශීන් මස්තකයෙහි පලක්බැඳ වැඩහිඳ–

දානං සීලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤාවිරියෙන පඤ්චමං,
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තු'පෙක්ඛා'ති'මෙදස.

යනාදීන් බුද්ධකාරක දශපාරමිධර්මයන් පරීක්ෂා කොට–

සො සාගරෙ ජලධිකං රුධිරං අදාසි
භූමිං පරාජිය සමං ස මදාසි දානං,
මෙරූපමාණමධිකංච සමොළි සීසං
ඛෙනාරකාධිකතරං නයනං අදාසි.

යනාදීන් සංසාරයෙහි සැරිසරා ඇවිදිනාවූ අප මහබෝසතාණෝ අනොපමවූ අසදෘශවූ අචින්ත්‍යවූ අවාච්‍යවූ අද්භූතවූ ප්‍රමාණාතික්‍රාන්තවූ පාරමිධර්මයන් පූරණයකරමින් විශ්වන්තරාත්මභාවයෙහි ජනිතවූ පුත්‍රකලත්‍රදානාදි පාරමිධර්මයන් කුළුගන්වා ඒ ආත්මභාවයෙන් චුතව තුසීපුරයෙහි ඉපිද එහිආයුපමණින් වැස දෙවිබඹුන් විසින්–

කාලො'යං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සුඅමතංපදං.

යනාදීන් ආරාධනා කලකල්හි දෙව්ලොවින් චුතව අප මහාබෝසතානෝ කිඹුල්වත් නුවර–

සුද්ධොදනො ච සො රාජා රාජා ච අමිතොදනො,
ධොතොදනොච සො රාජා රාජා සුක්කොදනො තථා,
සච්චිතොදනොති රාජානො පඤ්ච ඔදනනාමකා.

යනාදීන් ඔදනනාමයෙන් පඤ්චප්‍රකාරවූ රජදරුවන් අතුරෙන් සුදෙවුන් මහරජහු පිණිස මහාමායාදෙවීන් කුස පිළිසිඳ සම්පූර්ණවූ දශ එකඩ මසක් වැස–

සම්පුණ්ණගබ්භා දසමාසතො පරං
ගන්ත්වාන ඵුල්ලං වරලුම්බිනීවනං,
ඨිතා ගහෙත්වා වරසාලසාඛං
විජායි තං පුත්ත වරං සුඛෙන.

යනාදීන් මව්කුසින්බිහිව ශුක්ලපක්ෂාභිවර්ධමාන චන්ද්‍රමණ්ඩලානුකාරයෙන් ක්‍රමයෙන් වැඩිවියපැමිණ රාජාභිෂේක කොට–

සිඛප්පකොටි සිඛතෝ ලද්ධා දෙවිං යසොධරං,
චත්තාළීස සහස්සෙහි පුරත්ථීහි පුරක්ඛතො.

රම්ම සුරම්ම සුභෙසු ඝරෙසු
තිණ්ණමුතූණ මනුච්ඡවිකෙසු,
දිබ්බසුඛං විය භුඤ්ජසුඛං සො
අච්ඡරියබ්භුත රජ්ජවිභූතිං.

යනුහෙයින් එකුන්තිස් හවුරුද්දක් පඤ්චකාමයන් අනුභව කොට ගිනි ගෙයි වැස තුන් පූර්නිමිති දැක උයන් ගොස් මගුල් සලවට මත්තෙහි හුන්නේ සක්දෙව් රජහුගෙන් නියොගලත් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා අවුත් මගුල්කප්පු වෙසක් ගෙණ මහබෝසතාණෝ දහසක් වළුකො ඩොක්කුවෙන් යුක්තවූ සළුවඩා සර්වාභරණයෙන් සරහා දසදහසක් දිව සළුයෙන් හිස වෙලා මිණිඔටුනු පළඳවා උන් කෙණෙහි රාහුලනම් පුත් රුවන උපනැයි යනු අසා "රාහුලො ජාතො බන්ධනං ජාතං,, යනාදීන් කියමින් අසුර මර්දනය කොට නුවරට වදනාවූ ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් යුක්ත මහබෝසතාණෝ දුටු කිසා ගොතමීන් විසින්–

නිබ්බුතා නූන සා මාතා නිබ්බුතො නූනසො පිතා,
නිබ්බුතා නූනසා නාරී යස්සා'යං ඊදිසො පති.

යනාදීන් කියනලද නිබ්බුතපදයෙහි සන්තුෂ්ටව තමන්ගේ ග්‍රීවයෙහි පලන් ලක්ෂයක්වටනා මුක්තාහාරය බිසවට යවා වෛජයන්ත ප්‍රාසාදය හා සාදෘශ්‍යවූ මාලිගාතලයෙහි වැද ශ්‍රීයහන් මස්තකයෙහි පලක්බැඳ හිඳ නෘත්‍යාගාරයෙහි කලකිරි රහල්කුමරහු දකිම්යි යන අභිප්‍රායෙන් බිසවුන් ඔත් ශ්‍රීයහන් ගබඩාවට නික්ම බලා සිට–

යසොධරං පීන පයොධරා'ධරං
අනඞ්ගරඞ්ගඞ්ගජභූතමඞ්ගං,
දෙවච්ඡරා උජ්ජලිතං පතිබ්බතං
නිබ්බාගතො සො සුගතො ගතොව.

යනුහෙයින් නැවත අවුත් ජනකනම් ඇමැත්තහු පුබ්බුදුවා ජනකය අසකු සඳ ගෙණඑවයි කීකල්හි ඔහු විසින් සරහා පිළියෙළකරණලද්දවූ

අස්හලට වැද සියක්වර පොලානැඟු පුළුන්රැසක් සේ ඉතා ධවලවූ අටලොස්රියන් දිගඇති ඊට සුදුසු උසඇති කන්‍ථකනම් අශ්වරාජයා සඳ රාජාඞ්ගණයට එළඹවූ සඳ මහබෝසතානෝ ඔහුපිටට පැනනැඟී–

නානාසනානි සයනානි නිවෙසනානි
බාහාතිභානි රතනාකර සන්නිභානි,
ත්‍යාසසිතානි රතනධජ භූසිතානි
හිත්වාගතානි හිමබින්දු සමාගතානි.

යනුහෙයින් සසර පූර්වජාතියෙහි සැරිසරා ඇවිදිනාකල්හි සමීපයට එන යාචකජනයා දැක දොර නොපියවූ කුසලබලයෙන් දහසක් දෙනා විසින් පියාලනලද දහසක් දෙනා විසින් ඇරලනලද වහසල්දොර දෙවියන් විසින් හළකල්හි–

සුද්ධොදනස්ස යං පුත්තො සිද්ධත්ථො ලොකනායකො,
ජහිත්වා රාහු බධංච බොධාය අභිනික්ඛමි.

යනුහෙයින් සුදෙවුන් මහරජහට පුත්‍රවූ ලොකත්‍රයට අසහාය නායකවූ සිද්ධාර්ථ කුමාරතෙම චක්‍රවර්ති රාජ්‍යය හා සාදෘශ්‍යවූ ශ්‍රී සමෘද්ධි නැමැති රාහුමුඛයෙන් වර්ජිතව සම්‍යක්සම්බොධිඥාණය අවබොධ කරණු පිණිස රාජභවනයෙන් පිටත්ව තිස්යොදුනක් කතර ගෙවා අනොමානම් ගංතෙරට පැමින අස්රජහු පිටින් බැස මඟුල් කඩුව ගෙණ–

ජෙත්වාන මොළිං වරගන්ධවාසිතං
වෙහාසයං උක්ඛිපි සක්‍ය පුඞ්ගවො,
සහස්සනෙත්තො සිරසා පටිග්ගහී
සුවණ්ණචඞ්ගොට වරෙන වාසවො.

යනාදීන් රන්විදුලියක් නිල්වූ මෙඝකූටයක් වලඳනාපරිද්දෙන් මඟුල් කඩුවෙන් මුඳුන් කෙස්වැටිය කපා ආකාශයට දමූකල්හි සක්දෙව්රජහු විසින් නානාවිධ සුගන්ධයන් වහනයකරන්නාවූ ඒ කෙස්වැටිය රන් සුමුගකින් පිළිගත් කල්හි මහබ්‍රහ්මයන් විසින් සමීපයට එළවනලද අටපිරිකර පිළිගෙණ පැවිදිව එහි සන්තොසයෙන් සතියක් ඉක්මවා රජගහනුවරටවැඩ පිඩුසිඟා පාණ්ඩව පර්වතච්ඡායාවෙහි වැඩහිඳ වළඳා බිම්සර රජහට බුදුව වඩනාපරිද්දෙන් පිළිණ දී එතැන්පටන් සාවුරුද්දක් මහා වීර්‍ය්‍ය කොට දුෂ්කරක්‍රියා පුරමින් වෙසඟ පුණුපොහෝදවස් අජපාල නම් නිග්‍රොධමූලයට එළඹ සුජාතාවන් විසින් පිළිගන්වනලද කිරිපිඩු පිළිගෙණ–

වෙලානිලා’ලුලිත පල්ලව කෙළි ලීලා
දෙලා සුලොල’ලිකුලාවලිකෙළිරම්මෙ,
ඵුල්ලා’වලම්බකුසුමා’කුලසාලමාලෙ
නෙරඤ්ජරාසුපවනම්හි කදාරමාමී.

යනාදීන් විශෙෂයෙන් විස්තරකරණලද්දාවූ නිර්දොෂවූ ජලය ඇති හෙයින් නෙරඤ්ජරායයි යන නමින් ප්‍රසිඬවූ ඒගඟ පැන්සනහා පුලින තෙලෙහි වැඩහිඳ පිළිගත් කිරිපිඩු එකුන්පණස්පිඩක් කොට වළඳා තලිය උඩුගඟට ඇර ගංපස විසිතුරුවූ මල්පල්ලෙන් සැදීතිබෙන්නාවූ හමනලද මන්දමාරුතයෙන් ශරීරශර්මියන් සන්හිඳුවන්නාවූ විසාල සාල වෘක්‍ෂපන්තීන් ගැවසීගත්තාවූ දුටුදුටු සත්‍වයන්ගේ නෙතට ප්‍රියකරුවූ ඒ සාලවනොද්‍යානයෙහි දිවාවිහාර කොට සවස්වේලෙහි නික්ම ලොකවාසි සත්‍වයන්ගේ අඥානත්‍වය දුරුකරණ ඇසතුබොධිද්‍රුමමූලයට එළඹ සොත්‍ථියනම් බ්‍රාහමණයා විසින් දෙනලද අටමිටක් පමණ කුසතණ පිළිගෙණ බෝමුල සලාසිටි කල්හි පෘථිවිය විවුතව පැණනැගී තුදුස්රියන් උසඇති වජ්‍රාශන මස්තකයෙහි නැගී රජතස්ඣන්‍ධයක්සේ අති ධවලවූ ශ්‍රීමහාබොධියට පිටදී පර්‍ය්‍යඞ්කය බැඳ වැඩඋන් කල්හි දශදහසක් සක්වලෙහි නොයෙක් දිව්‍යබ්‍රහමයන් විසින් කරණලද පූජාසත්කාරයෙන් බෝමැඩ සොභාමත්‍වතුවූ කල්හි-

නානාවෙස විරූප භෙරව රවං සත්‍යාබ පක්‍ඛායුධං
මාපෙත්‍වාන'ග්ගි දුරුණං සුමහතිං සෙනං සසෙනාසයං,
මාරාරුයහ දියඩ්ඪයොජනසතං නාගංනාගං,වා'චලං
ඛ්‍යහවජං ගිරිමෙඛලං ගජවරං ඝුනාදසී මඃසරං.

දෑසෙත්‍වා බහුධා සුභිංසනාකරං මාරා'නුභාවස්සවසො
මාපෙත්‍වාන සහඃසබාහු මඛිලං දිත්‍තායුධායුජ්ජලං,
ගජ්ජේතෙතා වසුධාතලං නභතලංකනෙනකරාවං පලා-
පෙනෙතා බ්‍රහම සුරා'සුරෙච ගරුළෙ නාගෙ භයෙනාකුලෙ.

යනාදීන් කියනලද ප්‍රකාර ඇති ඒ වසවර්ත්‍තිමාරයා විසින් සර්‍වඥයන් වහන්සේ හා යුඬ කොට ජය ගන්නා පිණිස තමාගේ ආනුභාවයෙන් මවනලද භයඞ්කාරවූ වෙසසමූහයෙන්ද මෙසේම අල්වනලද චන්ද්‍රචක්‍රාදී විවිධායුධප්‍රකාරවූ ඛඩ්ගකුන්ත තෝමර භෙණ්ඩිවාලාදිවූ ආයුධ ගත්තාවූ දසඹිමරක් මාරසේනාව පිරිවරමින් කරණලද කුක්‍ෂවනාද මාත්‍රයකින්ම සත්‍වයන්ට අතිසයින්ම භයඞ්කාරවූ යෙළසියයක් යොදුන් උසඇති ගිරිමෙඛලානම් ඇත්රජහු පිටට පැණනැගී අනෙකප්‍රකාරවූ සත්හිසර සර්‍වාභරණ පැළඳ චක්‍රායුධනම්වූ ගිනිගෙණ දිලියෙන ගැසුක්‍ෂණයෙහිම මහමෙරවත් කිල්ල්කඩක්පරිද්දෙන් දෙකඩවනතරම් ආඥාසම්පණ්ණවූ ආයුධය ප්‍රධාන කොට ඇති දසදහසක් අතින් ගන්නාලද අවිපනරින් යුක්තවූ තමාගේ වීරවික්‍රමය බෝමැඩ පුදන පිණිස රැස්වනලද දශදහසක් සක්වල දෙවිබඹුන් ඇසපානාක්මෙන් වජ්‍රාශනය පිණිස කරණලද මානයෙන් බුදුන් කරා පැමින නවවිධ වර්‍ෂාවක් වස්වමින් කරණලද තමාගේ වීරවික්‍රමයෙන් බුදුන්ගේ ලොමකූප මාත්‍රයකටත් හානියක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

තුනුහුනුසේදූත රෙෂපත්‍ර සිටි ඕහට රැස්කරණලද කුසලසම්භාර නැමැති දශමහයොධයන්විසින් එකකට බිඹරක් බැගින්ම දශබිම්බරක් මාරසේනාව පරාජය කොට ජය ලත්කල්හි සර්වඥයන්වහන්සේ අරුණොද්ගමණය සමග සවාසනා සර්වක්ලේශයන් ප්‍රහීන කොට ලොවුතුරා බුදුව සත්සති සවා තපස්සුභල්ලුකාදීන් විසින් පිළිගන්වනලද මීපිඩු වළඳා ඔවුන් සරණසීලයෙහි පිහිටුවා පුදනපරිද්දෙන් කෙශධාතු දී මෑතභාගයෙහි බ්‍රහ්මාරාධනාවෙන් අපගේ සද්ධර්මචක්‍රවර්තිවූ ධර්මරාජන්වූ සමන්තභද්‍රවූ ෂඩභිඥවූ පරදුඃඛදුඃඛිතවූ කරුණානිධානවූ ත්‍රිභුවනචූඩාමාණික්‍යවූ අසරණ සරණවූ සරණාගත වජ්‍රපඤ්ජරවූ ත්‍රෛලොක්‍ය ස්වාමීවූ අනන්‍ය සාධාරණවූ ද්වාත්‍රිංශත් වර මහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යානුව්‍යඤ්ජනව්‍යාමප්‍රභාකෙතු මාලාලඞ්කාරයෙන්විරාජමානවූ සර්වඥයන්වහන්සේ නානාවිධ ගන්ධයෙන් සුගන්ධවූ සත්රුවන් කරඬුවක් විවෘතකරන්නාක්හු මෙන්ද දශපාරමිතා නමැති ජලයෙන්සම්භූතවූ සර්වඥතාඥාන නැමැති සූර්‍ය්‍යරශ්මීන් විකසිතවූ ජිහ්වා නමැති කර්ණිකා ඇති සුවිසුද්ධ අවිරල දන්තපන්තීන් නමැති කේශර පන්තීන්ඇති සුරකත වර අධරෝෂ්ඨ නමැති පත්‍ර පරිවෘතව සද්ධර්ම නමැති මධුබින්දු වැගිහෙන්නාවූ සශ්‍රීකවූ මුඛනැමැති පද්මය විදහා **“ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා යොචා’යං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනොගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යොචා’යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති”** යනාදීන් දම්සක්පැවතුම් සූත්‍රදෙශනාව කොට වප්‍ර අඤ්ඤාකොණ්ඩඤ්ඤ ප්‍රමුඛ අටළොස්කෙළක් බඹුන් සද්ධර්මාමෘත පානය කෙරෙමින් අඞ්ගයන් ඇස්ලැබ්ම් ආදිවූ ආශ්‍රවක්ෂයන් ලොකයෙහි පහලකරවා එතැන්පටන් බොහෝ දෙව්මිනිසුන් විනයනයකරවමින් ඒ සර්වඥරාජොත්තමයානන් වහන්සේ බුදුවූ නවවැනි දුරුතුමස පුණුපොහොදවස් ලඞ්කාවට වැඩ මහියඞ්ගණ චෛත්‍යස්ථානයෙහි දිගින් තුන් යොදනක් හා පුළුලින් යොදනක්ඇති නා: වනොද්‍යානයෙහි යක්ෂයන් සමීපයට ගොස් දෙව් දුනු විදුලි සන්ධ්‍යාවලාපටල දහස්ගණනින් පරික්ෂිප්තව හෙවත් ගැවසී ගත් රුවන්මෙරක්මෙන් ආකාශයෙහි පෙනී චතුරඞ්ගසමන්විත අන්ධකාරයක්මවා යක්ෂයන් තැතිගන්වා–

යක්ඛා භයං වො දුක්ඛඤ්ච හරිස්සාමි ඉදං අහං,
තුම්හෙ නිසජ්ජ ඨානම්මෙ සමග්ගා දෙථ නො ඉධ.

යනාදීන් වදාළ කල්හි–

ආහුනෙ සුගතං යක්ඛා දෙමමාරිස නෙ ඉමං,
සබ්බම්පි සකලං දීපං දෙහි නො අභයං තුවං.

යනාදීන් කියමින් එහින් භයපත්වූ යක්‍ෂයන් විසින් දෙනලද අවකාශ ඇති භූමියට බැස සම්කඩඅතුට සතර කොනින් නික්මුනු වහනිජ්වාලා වෙන් මුහුදුබත්වන යක්‍ෂයන්ට අභයදී ඔවුන් සන්තොෂකරවා යගගිරි දිවයින ආනුභාවයෙන් ගෙන්වා යක්‍ෂයන් එහි පිහිටුවා ඒ දිවයින පළමු පිහිටි ස්ථානයෙහි පිහිටන නියායෙන් අධිෂ්ඨාන කොට වදාළසේක.

එසේහෙයින් කියනලදී–

බොධිතො නවමෙමාසෙ ඵුස්සපුණ්ණමියං ජිනො,
ලඞ්කාදීපං විසොධෙතුං ලඞ්කාදීපමුපාගමී.

යනාදීන් කියනලද ක්‍රමයෙන් ලඞ්කාවට වැඩ ඒ ස්ථානයෙහි රැස්වූ දෙවියන්ට ධර්මදෙශනා කොට වදාරා ඔව්හු සතරමග සතරඵලයෙහි පිහිටුවා මහසමන් දෙව්රජහු පුදන පරිද්දෙන්–

සීසං පරාමසිත්වාන නීලා'මල සිරොරුහෙ,
පාණිමත්තෙ අදාකෙසෙ තස්ස පානි හිතො ජිනො.

යනුහෙයින් මේ ශ්‍රීලඞ්කාවට වැඩ හිස පිරිමැඩ මිටක් කෙශධාතු දී–

එවං දීපම්මිං කත්වා මනුස්සා රහම්ස්සරෙ,
උරුවෙල මහාධීරෙ උරුවීර පරක්කමො.

යනුහෙයින් මේ ශ්‍රී ලඞ්කාවිපය මනුෂ්‍යයන්ට වාසස්ථානයට සුදුසු කොට සලස්වා වදාරා මහත්වූ බලපරාක්‍රමයන් ඇත්තාවූ ප්‍රඥවන්තවූ ඒ සර්වඥයන්වහන්සේ උරුවෙල්දනව්වට වැඩිකල්හි-ලබනලද කෙශ ධාතූන්වහන්සේ ඉන්ද්‍රනීලමය කරඬුවෙන් මහියඞගන චෛත්‍යස්ථාන යෙහි පිහිටුවූහ. තවද දෙවෙනි ගමනෙහි–

පාතො යෙව සමාදාය පවරං පත්තචීවරං,
අනුකම්පාය නාගානං නාගදීපමුපාගමී.

යනුහෙයින් බුදුවූ පස්වැනිඅවුරුද්දෙහි බක්මස කළුවර දෙපොයෙහි ජෙතවනාරාමයෙන් වැඩ චූලොදර මහොදර දෙමසිල් නායින්ගේ මිණි පලගක් නිසා කරණලද යුධ සන්හිඳුවන පිණිස ඔවුන්ට බණ දෙසා වඩුන්නාගල අසූකෙළක් නායින් හා කැලනියේ හිස්කෙළක් නායින්ද සරණසීලයෙහි පිහිටුවා උන් විසින් එලවනලද දිව්‍යභොජනය පිළි ගෙණ මිණිපලඟ මත්තෙහි වැඩහිඳ වළඳා ඔවුන් පුදන පරිද්දෙන් ස්වර්ගමොක්‍ෂ සම්පත් සිඛවන පිණිස සුමණනම් දෙවුරජහු විසින් ජෙත වනාරාමයෙහි පටන් සිරසට ඉඳුනිල්මිණි ඡත්‍රයක්මෙන් කොට ගෙණ ආ කිරිපළුරුකද මිණිපලඟද පාරිභොගික චෛත්‍ය කොට ඔවුන් පුදන

පරිද්දෙන් සවගීමොඎ සිබිය චතුපිණ්ස සලස්වා වදුරා නැවත ජෙත වනාරාමයට වැඩ–තුන්වෙනි ගමනෙහි මණිඅක්ඛික නම් නා රජහුගේ ආරාධනාවෙන්–

බොධිතො අඪ්මෙවසෙස වසං ජෙතවනෙ ජිනො,
නාථො පඤ්චහි භික්ඛුහි සතෙහි පරිවාරිතො.

යනුහෙයින් බුදුවූ අටවෙනි අවුරුද්දෙහි වෙසඟ පුණුපොහෝ දවස් පන්සියයක් භිඤුන්වහන්සේ විසින් පිරිවරණලදුව–

කල්‍යාණි චෙතියඪානෙ කාරිතෙ රතනමණ්ඩපෙ,
මහාරහම්හි පල්ලඞ්ක උපාවිසි නරාසභො.

යනුහෙයින් සඟපිරිස් පිරිවරා මණිඅක්ඛික නම් නාරජහු විසින් මවාදෙනලද රත්නමණ්ඩපයෙහි පනවනලද බුඞාසන මස්තකයෙහි වැඩහිඳ–

දිබ්බෙහි ඛජ්ජභොජ්ජෙහි සගණො සගණං ජිනං,
නාගරාජා ධම්මරාජං සන්තප්පෙසි සුමානසො.

යනුහෙයින් පඹිත් සහිතව ඒ නාරජහු විසින් පිළියෙළ කොට එළවන ලද දිව්‍යවූ අන්නපානාදිය වලඳා සවගීමොඎසම්පත්තිය සාදා, දෙන් නාවූ සඞ්ම දෙශනාකොට සමන්දෙව්රජහු විසින් ආරාධිතවූසේක්–

පබ්බතග්ගෙ යථා අග්ගි පුණ්ණමාසෙව චඤ්දිමා,
වණ්ණං ඔභාසතෙ බුඞො සාලරාජාව ඵුල්ලිතො.

යනුහෙයින් පවීතශිඛරයෙහි දිලිහුනාවූ අග්නිස්කන්ධයක් සේද පෞර්ණමී දිනයෙහි උදයගිරි පවීතොද්භූත පූර්ණචන්ද්‍රයාමෙන්ද මොනවට සුපුෂ්පිත කරණලද සාලවෘඎයක්මෙන්ද සමනතකූටපවීත මස්තකයෙහි පෙනී වැඩසිට–

අඪ්සතුත්තම ලක්ඛණ යුත්තං
බ්‍රහ්මසුරාසුර මුඛිතරාජං,
කාමද කොමල භාසුර පාදං
සාධුනමෙ සිරසා මුනිරාජං.

යනාදීන් වණ්ණිතියවූ අටතුරාසියක් මඞ්ගල්‍යලක්ෂණයෙන් විරාජමානවූ ඒ ශ්‍රීපාදපද්මය දෙවියන් විසින් වස්වනලද පුෂ්පවරුෂා සත්රුවන් වරුෂාදිවූ අද්භූතවූ අනොපමවූ ආශ්චය‍ර්‍යයෙන් ඒ ශ්‍රීපාදය පවීතශිඛරයෙහි ඔබා ඒ පවීතප්‍රාන්තයෙහි සඞගණ පිරිවරින් යුක්තව වැඩහිඳ එයින් නැගී දිගාන්ධයට වැඩ ඒ චෛත්‍යය පිහිටන්නාවූ ස්ථානයෙහි භිඤුගණයා පිරිවරා වැඩහිඳ සමාපත්තියට සමවැද එයින් නැගිසිට අනුරාධපුරයට ගොස් ශ්‍රීමහාබොධිස්ථානයෙහිද රත්නමාලි චෛත්‍යස්ථාන

යෙහිද ථූපාරමයෙහිද චෝමිස්සක පර්වතය යනාදිවූ ස්ථානවල්හිද මෙහොතක් මොහොතක් කල් වැඩහිඳ රැස්වූ දෙවසමාගමයෙහි දෙවියන්ට අනුශාසනා කොට බණවදාරා ජේතවනාරාමයට වැඩ පන්සාලිස් හවුරුද්දක් මුලුල්ලෙහි වැඩහිඳ චාතුද්දීපික මහාමේඝයක් මෙන් සවාසූ දහසක් ධර්මස්කන්ධය දේශනා කොට කළමනාතාක් සියළු බුද්ධකෘත්‍යය කොට නිමවා මල්ලරජදරුවන්ගේ සාලවනෝද්‍යානයෙහි යුග්මසාලාන්තරයෙහි පනවනලද්දාවූ යානායෙහි සිංහසෙය්‍යායෙන් සැතපී වදාරා අනන්තාපරිමාණ සක්වළ විෂයක්ෂෙත්‍ර කොට ඇති කෙළලක්ෂයක් සක්වළ ආඥාක්ෂෙත්‍ර කොට ඇති දශදහසක් සක්වළ ජන්මක්ෂෙත්‍ර කොට ඇති ජනොවරයක් වැනිවූ මේ සතිස්ලක්ෂ දශදහස් තුන්සිය පණස් යොදුන් පමණ වට ඇති මේ අබතුරෙහි දශදහසක් යොදුන් ඇති පූර්වවිදෙහයද දශදහසක් යොදුන් ජම්බුද්වීපයද සත් දහසක් යොදුන් අපරගොයානයද අටදහසක් යොදුන් ඇති උතුරුකුරු දිවයිනද යන මේ සතරමහ ද්වීපයෙහිද දෙදහසක් පමණ ක්ෂුද්‍ර ද්වීප ඇති මේ මගුල්සක්වළින් නුත් මාගේ ශාසනය කොයි පවතිද්දෝ හෝයි දිව්‍යචක්ෂුසින් බලාවදාරා ලඞ්කාද්වීපයෙහි පන්දහසක් අවුරුදු මාගේශාසනය පවත්නී හස්තාමලකයක්සේ නිශ්චය කොට දැකවදාරා මහොත්සාහයෙන් තනාගත් ලඞ්කාව රක්නාපරිද්දෙන් දශදහසක් සක්වළින් රැස්වූ දෙව්බඹුන් අතුරෙහි සිටි සක්දෙවුරජහු සමීපයට කැඳවා–

පතිට්ඨිස්සති දෙවින්ද ලඞ්කායං මම සාසනං,
තස්මා සපරිවාරන්තං රක්ඛලඞ්කඤ්ච සාධුකං.

යනාදීන් මෙහෙවර වදාළකල්හි දසනඛ සමොධාන සමුජ්ජ්ලිතවූ අඤ්ජලිපුටය මුදුනෙහි තබාගෙන වදාළමෙහෙවර මුදුනෙන් පිළිගෙණ තමන් ඇසූ මෙහෙවර උපුල්වන් දෙව්රජහට ලඞ්කාව රක්ෂාවට සිටිවූ කල්හි–ඉක්බිති බුදුරජානන්වහන්සේ ගණනායක සත්ලක්ෂයක් ප්‍රධාන කොට ඇති කෙළගණන් භික්ෂූන්වහන්සේ හා ලක්ෂගණන් භික්ෂුනීන් වහන්සේට සවාසූදහසක් ධර්මස්කන්ධය "අප්පමාදෙන සම්පාදෙථ භික්ඛවෝ" යි යනාදීන් අකුළුවා වදාරා අවශෙෂ බොහෝ දිව්‍යබ්‍රහ්මයන් ඇතුළුවූ සනරාමර ලොකයාහට බණවදාරා සකන්ධපරිනිර්වාණධාතුවෙන් පිරිනිවී කල්හි සදෙවුලොව වැසි සියලු දිව්‍යබ්‍රහ්මයන් විසින්ද නාග සුපර්ණාදීන් විසින්ද සියලු ලෝවැසියන් විසින්ද කරණලද අභිසංස්කාර ඇතිව බුදුන් එක්සියවිසිරියන් උස ඇති චන්දන චිතකයෙහි සුවර්ණද්‍රෝණියට වඩා අදාහන කෘත්‍යය කළකල්හි–

අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතං,
අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතං.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

යනාදීන් සක්දෙවුරජහු ලවා උදන්හි කියවන තරම් ලොවට පින් කෙත්වූ මහසුප් මහතෙරුන්වහන්සේ යමහලට මධ්‍යනුවූ හෙයින් චිතකයෙහි වහනි නොනැගී තිබූකල්හි–වැඩිපසු ශ්‍රීපාද දෙකින් සවණ්ණ ද්‍රොණිය විවෘත කොට ගෙණ පිටතට නික්මුණු කල්හි ශ්‍රීපාද වන්‍දය දෑතින් අල්වා සිසමුඳුනෙන් පිළිගෙණ–

සසිරිකතරෙ නාථො කෙතුමාලාය ලඞ්කතො,
දක්ඛිණා'වත්තකෙසොසි නීලා'මල සිරොරුහො.

උණ්හීස සීසො රුචිරෙ පරිපුණ්ණ සිරෙවරෙ,
අනොලොකිත මුද්ධාසි සුගන්ධතර මුද්ධතො.

උණ්හීස රුචිරෙදර ලලාටතට සොභිතො,
මුදුතූලනිභොදාත උණ්ණාමණ්ඩල මණ්ඩිතො.

යනාදීන් ගාථාසතකින් රූපවර්ණනාව හා ගුණවර්ණනාව කොට වදාළකල්හි ශ්‍රීපාද දෙක ස්ථාස්ථාන යෙහි පිහිටියේය චිතකයෙහි වහ්නි ජ්වාලාවෝනැගී ආදහනකෘත්‍යය සම්පාදනය කළහ. ඉක්බිති ඒකාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතාධර්මයන් පූරණය කොට අග්‍රප්‍රාප්තවූ දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේගේ අතවැසිවූ සරභූ නම් තෙරකෙනෙකුන්වහන්සේ විසින් ධාතු භින්නවීමට පූර්වභාගයෙහි තමන්වහන්සේගේ සාධ්‍යානුභාවයෙන් චිතකයෙහි වහනි නොනිවෙන තුරු සවර්ණමුනිඳග හෙරිසණ්ඨානවූ ග්‍රීවාධාතූන්වහන්සේ ඇරගෙණ ගොස් මහියඞ්ගන චෛත්‍යයෙහි පිහිටුවා වදාළසේක. මේ ක්‍රමයෙන් ඛේමනම් එක් තෙරකෙනෙකුන්වහන්සේත් අපගේ ශ්‍රී දන්තධාතූන් වහන්සේ ඇරගෙණ ගොස් කාලිංගපුරයෙහි රජකරණ කලිඟුරජහට හෙවත් බ්‍රහ්මදත්ත රජහට බණකියා කුදෘෂ්ටි ආදීවූ මිථ්‍යාදෘෂ්ටි හරවා රත්නත්‍රය ප්‍රසාදයෙහි පිහිටුවා දන්තධාතූන්වහන්සේ පුදන පරිද් දෙන් ඔහට දුන්කල්හි ඒ දළදාවහන්සේ කෙරෙහි පහන්වූ බ්‍රහ්මදත්ත රජතෙම–

සුවණ්ණ ඝටිතාලම්බ මුත්තාජාලෙහි සොභිතං,
කූටාගාර සතාකිණ්ණං තරුණාදිච්ච සන්නිභං.

යනුහෙයින් රන්කම් කොට එල්වනලද්දාවූ මුතුදැල් පඞ්ක්තියෙන් හැවසීගත් කුළුගෙවල් සියගණනින් බාලාර්ක බිම්බයක් මෙන් අනෙක ශ්‍රීවිභූතීන් විරාජමානවූ නොයෙක් රත්නයන්ගේ සොභාමානයෙන් ඇස් දල්වා බැලිය නොහැක්කාක්බඳුවූ දෙව්ලොවට හා නිවන්පුරයට වාහනයක් බඳුවූ සියලු ලෝවැසියන්හට අධිකප්‍රසාද එළවන්නාවූ දළදා ගේ එහිම–

මුත්තං මණිං වෙළුරියංච සංඛං
සිලප්පවාලං රජතං සුවණ්ණං,
මසාරගල්ල'මපිච ලොහිතඞ්කං
දසප්පකාරං රතනං වදන්ති.

යනාදීන් කියනලද මුතු ඉඳුනිල්මැණිකින්ද වෛඩූර්‍ය්‍යී රන් බැඳි සක් රන් බැඳි ගල් පබළු ගල් මැසිරි ගල් රන්බැඳි රිදී ලෙහෙවන් මැණි කැයි කියනලද මේ දශප්‍රකාරවූ රත්නයන් සම්බන්ධවූ හුදු රුවන්මයවූ ආසනයක්ද කරවා දළදාවහන්සේ එහි වඩා රාත්‍රිදිනයෙහි අප්‍රමාදවූ සිහින් සඳුන් කපුරු කස්තුරු අගරු දෙව්දුරු කළුවැල් තුවරලා දුම් ආදිවූ නානාවිධ සුගන්ධද්‍රව්‍යයෙන්ද නාගපුන්නාග චම්පක සලලාසොක නීප සහකාර කර්ණිකාර කොවිළාර පාටලී සින්දුවාර ආදිවූ පුෂ්ප ජාතීන්ද-දාසමන් සීනිද්ද බොල්ද්ද සෞගන්ධික ආදිවූ ථලජ පුෂ්ප යෙන්ද උත්පල කුමුද පුණ්ඩරීක පදුම යනාදිවූ ජලපද්මාදියෙන්ද අනෙකප්‍රකාර පුෂ්පජාතියෙන්ද කරණලද නිරන්තර පූජෝත්සවයෙන්ද-ආතතය විතතය ආතතවිතතය ඝණය සුසිරය යන පඤ්චාංගික තූර්‍යනාද යෙන් අනවරත පූජෝත්සව කෙරෙමින්-අභිසානුක්‍රමයෙන් නොයෙක් රජදරුවන් විසින් යථොක්තවූ සුචරිතය පවත්වා අවසානයෙහි ගුහසීව නම් රජහට රාජ්‍යභාරප්‍රාප්තවූ කාලයෙහි ස්වාර්ථපරාර්ථ නොදන මොහයෙන් මුළාවූ අඥාන අචෙලකයන්ගේ බස් ගෙණ පොරණ කුල පරපුරෙන් පැවත ආ සම්‍යක්දෘෂ්ටිය හැර දුර්ලබ්ධි ගෙණ බුද්ධශා සනයෙහි පැහැදීමක් නැතිව දන්තධාතූන්වහන්සේට කරණලද පූජා සත්කාරයෙහි රජහු උපෙක්ෂාවූ නියාව දුන නාගරික ජනයා විසින් දිව්‍යපුරයක් මෙන් නුවර සජ්ජිතකොට නගරමධ්‍යයෙහි මණ්ඩපයක් කරවා එහි විචිත්‍ර චිත්‍ර විතානාදිය බැඳ බොහෝ ජනයා සමාගමව. දීප ධූප සුගන්ධ පුෂ්පාදීන්ද යුක්තව මණ්ඩප මධ්‍යයෙහි පනවන ලද යානා වෙහි ශ්‍රී දන්තධාතූන්වහසේ වඩා සියදහස්ගණන් පිළින්ස සිසාරමින් යනාදිවූ නොයෙක් සතුති ඝොෂා අසා මේ කිමෙක්දැයි විචාලකල්හිබුද්ධ ශාසනයෙහි පැහැද සිටි ඇමත්තක්හු විසින් මේ අවසර යහපත සම්‍යක්දෘෂ්ටියෙහි රජු පිහිටුවාගණුම්හයි යන සමාධියෙන් යුක්තව නුඹවහන්සේගේ සත්වන කුලපරම්පරාව නොවරදවා නොහැර පැවත ආ දන්තධාතූන්වහන්සේට කරණලද පූජායයි ඒ අමාත්‍යයා විසින් දැන්වූ කල්හි එසේද දන් මා ගියමැනවැයි සමාධියෙන් යුක්තව එකාහින් සළුව ගෙණ වනා ගොස් පණින් මධ්‍යයට වැද නමස්කාර කොට ස්වාමීනි මේ තෙක්කල් මුළුල්ලෙහි මා විසින් නුඹවහන්සේ නොහැඳින වසනලදැයි හැත්නවු ් කෙරෙහි නොදුන කළවරද ක්ෂමා කොටවදාරණ ධාතූනායසී පා සියමුඳුනෙහි පිහිටිය මැනවැයි ආරාධනා කළසඳ-ච[illegible]ක්යේ

ආකාශයට පැනනැගී ඔහු සියමුදුනෙහි පිහිටියේය. ඒරජතු සන්තොෂකරවා ප්‍රීතියෙන් ප්‍රමුදිත ශරීර ඇතිව ඒ ගුහසීව රජ්ජුරුවන් තමන් වසන මාලිගාතලයට දළදාවහන්සේ වඩා මැනභාගයෙහි රුවන් දළදා ගෙයක් කරවා මාහැඟි පූජාසත්කාර පවත්වා උන්කල්හි දුර්ලබ්ධිගත් අචෙලකාදිවූ නොයෙක් නුවටතු එකල ජම්බුද්වීපයෙහි අගරජකරන්නාවූ පඬුවස් රජතු කර පැමිණ කලිගුරට තොප අතවැසිවූ ගුහසීව නම් රජෙක් තොපවැනි රජදරුවන් වැඳපුදන විෂ්ණු මහෙශ්වර නාරායනාදිවූ ලොකප්‍රසිද්ධ දෙවියන්ට නින්දා කොට මිනී ඇටයක් පුදන්නේයයි කී කල්හි එකියන වචන අසා කොපයෙන් දිලිහී තමන් බැනවූ චිත්‍රයාන රජ්ජුරුවන් සමීපයට කැඳවා එඹා චිත්‍රයානයෙහි කලිගුරට ගොසින් ගුහසීව රජතු හා ඔහු විසින් පුදනලද මිනී ඇටයහා ගෙණෙවයි සිවුරඟ සෙනඟ දී යැවූ කල්හි ඒ චිත්‍රයාන රජ්ජුරුවෝ පැලලුප්නුවරින් නික්ම ක්‍රමයෙන් කලිගුපුර සමීපයට පැමින කඳවුරු බැඳ උන්කල්හි කලිගුරජ ඒඅසා ඔහුලඟට ඇතුන් අසුන් මුතු මැණික් ආදිවූ මාහැඟි පඬුරු රාජපුරුෂයන් අත යවා ඒ රජතු සිත්ගෙණ ඔහු තමහට හිතවූ බව අසා දූන තුමුද ඒ රජූකර පැමිණ ඔවුනොවුන් දැක සන්තොෂයෙන් ආලිඞ්ගනය කොට මිත්‍රසන්ථවය සවිරකොට දෙදෙන සමගව–

පාකාර ගොපුරට්ටාල පාසාදඞ්ගඞ්ක චිත්තිතං,
දන්තසාලාති සො රාජා සම්ඹං පුරමද්දස.

යනාදීන් කියනලද වාසල් පවුරු අට්ටාල චිත්‍රවින්‍යාස දන්තශාලාදිවූ අනෙකප්‍රකාර ශ්‍රීසමෘද්ධියෙන් බබලන්නාවූ ඒ දන්තපුරනම්වූ නුවරට වැද මාලිගාතලයට නැගී ශ්‍රී දන්තධාතුන්වහන්සේ වැඩඋන් රුවන් දළදාගෙය දකිමින් සතුටුව සර්වඥයන්වහන්සේගේ පාරමිතා නමැති සවණ්ණලතායෙහි හටගත් කුමුදු මුකුලයක්බඳුවූ ඒ දන්තධාතුන්වහන්සේ වැඩඋන් දළදා කරඬුව දැක එකත්පස්ව සිට අපගේ නායකවූ පඬුවාස දෙවියන්වහන්සේ විසින් තුබවහන්සේ හා මේ දළදාවහන්සේ ගෙන්වාගෙණයන පිණිස අප එවනලද–එසේ හෙයින් දන්තධාතුන්වහන්සේත් වඩාගෙණ තුබවහන්සේ අප හාසමග අවමැනවැයි ජම්බුද්වීපයට නායක රජ්ජුරුවන්වහන්සේගේ වචනය අසා ලඞ්ඝණය කළ නොහැක්කැයි කියා චිත්‍රයාන රජජූරුවන් කී කල්හි ඒ වේලෙහි ගුහසීව රජතෙම දළදාවහන්සේ දසාවට දෙහොත් මුදුනෙහි තබාගෙණ සතරමර ලොකවාසීවූ සත්‍වයන්ගේ මොහ නමැති අන්ධකාර දුරිකරණයට සර්වඥ නමැති උදයගිරිපර්වතොද්භූතවූ චන්ද්‍රරෙඛාවක් බඳුවූ දන්තධාතුන්වහන්සේත් වඩාගෙණ මාත් යනලෙසට කැඳවා ආ රජ්ජුරුවන්වහන්සේට ප්‍රාතිහාර්‍ය්‍යයක් දැක්වුවහොත් යහපතැයි කියා ආරාධනාකළකල්හි–

අබ්භුග්ගතාච ගගණකුහරං චන්දලෙඛාභිරමා
විස්සජ්ජෙන්ති රජත ධවලා රංසියො දන්තධාතු,
ධූපායන්ති සපදි බහුධා පජ්ජලන්ති මුහුත්තං
නිබ්බායන්ති නයනසුභගං පාටිහීරං අකාසී.

යනුහෙයින් පෙර දෙපෝයෙහි චන්ද්‍රරේඛාවක් මෙන් මනොඥවූ ඒ දළදාවහන්සේ රුවන් කරඬුවෙන් පිටත්ව ආකාශකුහරයට පැනනැගී රක්තවර්ණියට බඳුවූ රශ්මිමාලා විහිදුවමින් ඒ ක්ෂණයෙහි දුම්කඳක් මෙන් දුමමින් නැවත සඳරැසක් මෙන් සියලුනුවර ඒකාලොකකොරෙමින් බබුළුවමින් නැවත ගිනිකඳක් මෙන් දිලියෙමින් අනේකප්‍රකාරවූ ප්‍රාතිහාර්ය්‍යනමැති ආශ්චර්ය්‍ය රජ්ජුරුවෝ දැක සතුටුවූසිතින් බොහෝ දවසක් පුරුදුව ආ මිථ්‍යා දෘෂ්ටිහැර තිසරණයෙහි පිහිටුවා සියලු සිව්රඟ සෙනඟ හා සමගින් විසිතුරුවූ පූජා කොට ඉක්බිති කල්හි යනුපිණිස—

රාජා තතො දන්තපුරං ධජෙහි
පුප්ඵෙහි ධූපෙහිච තොරණෙහි,
අලඞ්කරිත්වාන මහාවිතාන-
නිවාරිතාදිච්ච මරීචිජාලං.

යනාදීන් ඒ ගුහසීව රජතෙම ස්වකීයවූ රාජභවනයද වීථිවින්‍යාස උභය පාර්ශ්වයද වඩනාමගද සුදුසු කොට කළුවැලිපියා සුදුවැල්ලෙන් තවරා නානා ස්ථානයෙහි වින්‍යාස කොට ලනලද රන්තොරණ රිදී තොරණ පිළී තොරණ මල් තොරණ කෙහෙල් තොරණ ආදිවූ තොරණපඞ්ක්තියෙන්ද රන්වැට රිදීවැට ලියවැට දඬුවැට ආදිවූ පහන්වැට පඞ්ක්තියෙන්ද සවර්ණකුම්භ රජතකුම්භ ආදිවූ ඝට පඞ්ක්තියෙන්ද නගනලද රන්ධජ රිදීධජ ආදිවූ නොයෙක් ධජපතාක පඞ්ක්තියෙන්ද කළුවැල් අගරු දෙව්දුරු මේ ආදියෙන් ලනලද සුවඳසුඹුළු සුන් පඞ්ක්තියෙන්ද සූර්යරශ්මිවලකනපිණිස ඛොම කොසෙය්‍ය කොදුම්බර ආදිවූ නානාවිධ වස්ත්‍රයන්ගෙන් බඳනාලද විචිත්‍ර විතානපඞ්ක්තියෙන්ද ඒ විතානයෙහි එල්වනලද්දාවූ සියදහස්ගණන් ඕලම්බක පද්මයන් හා කුසුම දාම පඞ්ක්තියෙන්ද අභිනව දිවාකරකිරණ දර්ශනයෙන් පිපිවැනිගියාවූ පස්පියුම් වනයක් හා සාදෘශ්‍යවූ නානාරඞ්ග වර්ණ ඇති ඡත්‍රසමූහ නංවමින් මෙසේම අනෙකප්‍රකාරවූ සින්ධූර පඞ්ක්තියෙන්ද රන්සන්නාහ බහා පිළියෙළකරණලද්දාවූ ඇත් සෙනගින් හා අස් සෙනඟින්ද සත්‍රුවන්මය කර්මාන්ත කොට නිමවනලද චක්‍රපන්තීන්ද යුක්තවූ රථපඞ්ක්තියෙහි යොදනලද සෛන්ධවයන්විසින්ද ඒඒ ස්ථානයෙහිසිට සතුතිඝොෂා කරණලද වන්දිභට්ටයන් විසින්ද පූග පුන්නාග චම්පකාසොක සලල කර්ණිකාර සීනිද්දබොලිද්ද ජය සුමනාදිවූ නොයෙක් පුෂ්පජාතියෙන්ද මාර්ගදිගාන්තරයෙහි ඉසිමින් නානාප්‍රකාර ඛඞ්ගකුන්තතොමරහෙණ්ඩි

15702

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

චාල කරවාලාදී චන්ද්‍රචක්‍රායුධ ධනුපඞ්කති ගත් නොයෙක් ලක්ෂගණන් පාබල සෙනඟින්ද මහබෙර මිහිඟු බෙර ලොහො බෙරගැට බෙර පනාබෙර එකැස් බෙර ඩවුර තම්මැට නිසාන ආදිවූ නොයෙක් භෙරි සඞ්ඛනාදයෙන් මහත්වූ සමුද්‍ර ඝොෂාවක් මෙන් නුවරද මාගීයද විස්තර කෙරෙමින් නිමාවක් නැත්තාවූ පූජෝත්සවයෙන් හා නොයෙක් ශ්‍රීවිභූතීන් යුක්තව ඒ ගුහසීව රජද සර්වාභරණයෙන් සැරහී අභිෂෙකබරව සුන්දනායෙන් හා ශ්‍රීවිභූතීන් චන්ද්‍රබිම්බයෙහි ශ්‍රී දරන්නාවූ විචිත්‍රකර්මාන්ත කරණලද රාජරථයකට පැනනැගී ශ්‍රී දන්තධාතුන් වහන්සේ සියමුදුනෙන් වඩාගෙණ ජිතනයාන රජ්ජුරුවන් හා සමග ඒ දන්තපුරයෙන් නික්ම ක්‍රමයෙන් මාර්ගාතික්‍රාන්ත කොට ක්‍ෂුද්‍ර ද්වීප පන් සියයකින් පිරිවරණලද්දාවූ ජම්බුද්වීපයට නායකවූ පැළලුප්නුවර පඬුවාස රජ්ජුරුවන් සමීපයට පැමිණ ඔහුදක සිටිකල්හි ඒ රජ්ජුරුවෝ කලිඟු රජහට කියන්නාහු ලොකප්‍රසිද්ධවූ අපවිසිනුත් පූදනලද්දාවූ විෂ්ණු මහෙශ්වර නාරායනාදිවූ දෙවියන්ට නින්දා කොට තොප විසින් මිනීඇටයක් නබාගෙණ පූදනලදුයේයයි ඇසූම්හ එතියන මිනීඇටය අප සමීපයට ගෙණෙවයි කියා ගෙන්වාගෙණ නිර්ලජ්ජවූ එහෙයින්ම හිරි ඔතප් නැත්තාවූ පව්ටුවූ නුවටුන්ගේ රිස් ගිවිස ඒ රජ ඔවුන් ලඟට කැඳවාගෙණ දන්තධාතුන්වහන්සේ ඒ නුවටුන් අතට අලකල්හි රාජාඞගන මධ්‍යයෙහි වලක් බිදුවා කිහිරඟුරු පුරවා ගුහසීව රජහු විසින් පූදනලද තෙල මිනීඇටය ගිනිගෙණ දිලියෙන්නාවූ අඟුරුරැස මස්තකයට දමවයි නියෝග කෙළේය. ඒ නිවටුන් විසිනුත් බොහෝවූ සමාධියෙන් යුක්තව තමන්ගේ හෘදයෙහි ගුණලවයක් නැත්තාවූ රෞරව නරකයසේ ඉතා දැඩිවූ ඒ අඟුරුරැස මස්තකයට ශ්‍රී දන්තධාතුන්වහන්සේ ඇරගෙණ දැමූහ. එසේ දැමූකල්හි—

තස්සානුභාවෙන තමඟගිරාසිං
හෙත්වා සරොජං රථචක්කමත්තං,
සමන්තතො උග්ගත රෙණුජාල
මුට්ඨාසි කිඤ්ජක්ඛ භරාභිරාමං.

තස්මිං ඛණෙ පඞ්කජකණ්ණිකාය
පතිට්ඨිතා ජිනදන්තධාතු,
කුන්දාවදාතාහි පභාහි සබ්බා
දිසා පභාසෙසි පභස්සරාහි.

යනුහෙයින් ඒ දළදාවහන්සේ අඟුරුරැස මත්තට දැමූකල්හී උන් වහන්සේගේ ආනුභාවයෙන් ඒ කිහිරඟුරුවල පලාගෙණ මහත්වූ රථ සක්කසේ පමණඇති මුවරද සමූහයෙන් ගැවසී ගත්තාවූ සුවඳ වනණය

කරන්නාවූ පියුම් කෙමියක් මත්තෙහි පිහිටා කොඳකැකුලට බඳුවූ රශ්මි සමූහයෙන් සියලු දසදිගුන් බබුළුවමින් ප්‍රාතිහාර්‍ය්‍ය කොට ඒ පියුම් මත්තෙහි වැඩඋන් කල්හි ප්‍රසන්නවූ සිත්ඇති ඒ නුවර මනුෂ්‍යයො ඒ ආශ්චර්‍ය්‍යය දැක නොයෙක් රුවනින් පුද, තමතමන් ගත් දුර්ලබ්ධි අල කල්හි ඒ පඬුවස් රජතෙම බොහෝදවස් පුරුදු කොට ආවාවූ මිථ්‍යා දෘෂ්ටිනැමති අන්ධකාරයෙන් මුඩවූයේ එමනිවටුන් ලඟට කැඳවා තෙල මිනීඇටය ඇරගෙණ කිණිහිරක් පිට තබා යකුලකින් පැහැරපියවයි නියොග කළකල්හි ඒ නිවටුන් විසින් නියෝගලත් පරිද්දෙන් කිණිහිර පිට තබා යකුලකින් පහරින්ට යකුල ඔසවා ගත් කල්හි කලල් පිහිර යටවත් සාර්ථික මාණික්‍යයක් මෙන්ද, නවද අස්තගිරපර්වතයෙන් භාගයක් ගිලී අඩියක් පෙනුනු චන්ද්‍රරේඛාවක් මෙන්ද දෘශ්‍යමානව ධවලවූ රශ්මිකදම්බයෙන් දශදිගාන්තරය ඒකාලොක කෙරෙමින් වැඩඋන් කල්හී—ඒදැක විස්මපත්වූ රජහට ඊෂ්‍යාවෙන් යුක්තව ගුණමකු දුරාචාරිවූ එක් නිවටුවෙක් රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ ඇයි රජ්ජුරුවෙනි තෙපි.කිමෙකැයි සිතව්ද ? මෙසේවූ විශෙෂයක් ඒකානන්තයෙන් ඇත්තේ ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ඇටයෙකැයි නොසිතව මේ ලොකයෙහි රාමය, විෂ්ණුය, මහෙශ්වරය, නාරායනය යනාදිවූ අප අපගේ අවතාරයො ඇත මෙයින් ඉන් එක් අවතාරයෙක මිනීඇටෙකත් මෙසේවූ ආශ්චර්යයක් ඇද්දැයි කීයේය. මෙසේ කී ඒ නිවටුන්ට ඒරජ කියන්නේ තොප තොපගේ රාමරාම, භ්‍රගුරාම, ඊරසුරාම, විෂ්ණු, මහෙශ්වර, නාරායනාදිවූ මුත් ඇම විසින් තබණලද ශරීරාවතාරයෙක් වීනම් තොපි ඇම එක්ව තොපඇමගේ දෙවියන්ගේ ගුණකියා තෙල කිණිහිරින් මැත් කොට ගන්වයි කීකල්හී ඒ අතිරිකයන් විසින් තමතමන්ගේ නාරායනාදිවූ නොයෙක් දෙවියන්ගේ සතුති ආදිවූ ගුණ කියා කිණිහිරින් මැත් කොට ගන්ට අපොහොසත්වූහ. එවේලෙහි රජ්ජුරුවෝ කියන්නාහු ඒ මිණී ඇටය මැත්කරගන්ට නිසි කෙණෙකුන් පරීක්‍ෂා කරවයි කියා එසේ නිසි කෙණෙක් ඇත්නම් උන්ට බොහෝ සම්පත් දෙම් කියා නුවර බෙරලා ඇසුරුවූ කල්හි අපගේ සර්වඥරාජොත්තමයානන්වහන්සේට සිවුපණස්කෙළක් ධන වියදම් කොට ජෙතවනාරාමය කරවූ අනේපිඩු මහසිටානන්ගේසන්වැති මුනුබුරුවූ සුභද්‍රනම් සිටානකෙනෙක් මම ඒ ශ්‍රීදන්තධාතූන්වහන්සේ කිණිහිරින් මැත් කෙරෙමියි බෙර වලක්වා රජ්ජුකරා එලඹ සිටිකල්හී ඇයි සගයානෙහි තොපට පුළුවන්දැයි විචාලකල්හි පුළුවන සවාමිනියි කීහ. එසේවුවහොත් කිණිහිරෙන් මැත්කරවයි නියොගලත් සුභද්‍රනම් සිටානො ඉස්සොද, නහා අළුත්වූ වස්ත්‍රයක් හැඳ ඒකාංශ කොට උතුරුසළුවක් බහා දක්ෂිණජානු මණ්ඩලය භූමියෙහි ඔබා දෙහොත් මුදුනෙහි තබාගෙණ දළදාවහන්ස නුබවහන්සේ නම් මෙසට සාරාසඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි සසර

සැරිසර ඇවිදිනාවූ ඔබවහන්සේ සිවිරජ කල පස් පෑ දිය්නාවූ ඇස් ඉල්වා ආ අන්ධබ්‍රාහ්මණයාහට ඇස්දෙක උපුටා දුන්සේක; තවද සහව උපන් එක්ජන්මයෙක්හි ක්ෂුධායෙන් පීඩිතයෙම්සි ආ ශක්‍රබ්‍රාහ්මණයාහට සක්දෙවුරජුබව නොදන යාචකයෙකැයි යන සංඥාවෙන් ඔහු දල්වාදුන් ගිනිකඳ මැදට පැන ඇඟමස් දන්දුන් සේක; තවද ඡද්දන්තජාතක යෙහි සත්අවුරුදු සත්මස් සත්දවසකින් මනොත්සාහයෙන් ඡද්දන්තවිල සමීපයෙහි අටදහසක් අරළි ඇති මහමේකුලක් සේ සිටිනා නුගගසමුල වලබිඳ එහි සැඟවීසිට සර්වප්‍රකාරයෙන් ධවලවූ රජත පර්වතයක් සේ මහත්වූ ශරීරයට විෂපෙවූ හීයකින් ජීවිතක්ෂයට පමුණුවනතරම් වේද නාපැමිණවූ ඒ සොනුත්තරනම් වැද්දාහට සවණක් ඝණරැස් විහිදුනාවූ දළදෙක කපාදී ඔහුගේද රජබිසවගේද මනදොළ සිඩකළසේක; තවද ක්ෂාන්තිවාදජාතකයෙහි කලාබුනම් රජහු කිපි නෙපි කවුරුදැයි විචාල කල්හි මහරජ මම ක්ෂාන්තිවාදියෙමි කීකල්හි එසේඋවහොත් නොපගේ ක්ෂාන්තිය පරීක්ෂාකරම්හයි ඒරජහු විසින් කටුසැමිටි ආදියෙන් පහර සිය දහස්ගණන් ගස්වා නොයෙක් ව්‍යසන කළකල්හිත් ක්ෂමාමම පැවැත්වූ සේක; තවද ධර්මපාල ජාතකයෙහි ධර්මපාලනම් සත්මැසි කුමාරව බිසවුන් කෙරෙහි කරණලද රොෂයෙන් තමන්වහන්සේගේ හස්තපාද දිය ඡේදනය කරණ්නාවූ රජහු කෙරෙහිද ඒදුක්බලා සෙනාහයෙන් අඩන මැනියන් කෙරෙහිද සමව මෛත්‍රී පැවැත්වූසේක; මෙසේම තවද වානරව උපන් එක්ජාතියෙක්හි අසත්පුරුෂවූ දෙව්දත්හු විසින් පහණින් පහළ කල්හිත් ඔහුකෙරෙහි රොෂයක් නොකොට ඔහු ඒ දුකින් මුදවා මනුෂ්‍යපථයෙහි ලා ව්‍රණමුඛයෙන් වැගිරෙණ රුධිරයෙහි පවා මාගේ ශරීරයෙහි පිරී තිබෙණ මෛත්‍රිය හෝ පිටත්වූයේයයි ප්‍රීති උපදවා චිත්ත දෝෂය නොකොට සන්තොෂයට පැමිනිසේක. තවද මෙසේම එක් ජාතියෙක්හි රුෂ්ටවූ මාරයා විසින් බොධිසත්ව භූමියෙහිදී නුඹවහන්සේ විසින් දෙනලද්දවූ දානාන්තරය කෙරෙමියි පසේබුදුන්වහන්සේටත් නුඹවහන්සේටත් අතරෙහි මවාපානාලද ගිනිගෙණ දිලියෙන අඟුරු වල දැක–

"කාමං පතාමි නිරයං උද්ධපාදො අවංසිරො,
න පුනාරියං කරිස්සාමි හන්දපිණ්ඩං පටිග්ගහො" යි.

යනාදීන් පසේබුදුන්වහන්සේට කියමින් සහලඟුරුවල මධ්‍යයෙහි පය එබූ කල්හී මුවරදසලායෙන් ගැවසී පැනනැඟී මහා පියුමක් මධ්‍ය යෙහි සිට තමන්වහන්සේ දෙන දානයම සිඩකළසේක; තවද එක් ජාති යෙක්හි රන්වන් මුවරජව ඉපිද ගර්භිණීව මරණට පැමිණ දංගෙඩියෙහි ඉසතබා නොත් තරුණ මෘගධෙනුවට අභයදී තමන්වහන්සේ ඒ මෘග ධෙනුවට මාරුවෙහි දංගෙඩියෙහි හිසතබා නොත් කල්හි ඒ ඇසූ බර

ණැස් රජහු අතින් දහසක් මුවන්ටද සෙසු වනයෙහි චතුෂ්පාද ජාතින්ටද පක්‍ෂිජාතීන්ටද මත්‍ස්‍යකච්ඡපයන්ටද අභයදෙවා ඒ රජහුද දශරාජ ධර්‍මයෙන් රාජ්‍යය කරණ ලෙස අවවාද දුන්සේක; තවද සම්භව ජාතකයෙහි සම්භව කුමාරයයි යන නමින් ප්‍රසිද්ධව සත්හවුරුදු වයසට පැමිණ වීථියෙහි වැලිකෙළියෙහි තත්පරවූසේක් සුචිරත නම් බ්‍රාහ්මණ පණ්ඩිතයන් විසින් විචාරණලද ගූඪවූ ධර්‍මයාග නම් ප්‍රශ්නය ප්‍රකාශ කොට ලෝවැසියන්ගෙන් පූජා ලත්සේක; තවද එක් ජාතියෙක්හී කපිකුලව හෙවත් වඳුරන්ට නායකව ඉපිද සවකීයවූ ජීවිතයෙහි ආසාවක් නොකොට මහ වේවැලක් ඉඟ බැඳගෙණ අනික් කෙළවර ශාඛාවෙක්හි බැඳ ගඟින් එතර සිට වෘක්‍ෂයකට පැන සියදහස් ගණන් ශාඛාමෘගයන් පිටමැඩගෙණ යනකල්හිද කෙළවර යන නායක වඳුරා විසින් පිට මැඩ දුකට පැමිණවූ කල්හිත් තමන්වහන්සේ පුරුදු කොට ආවාවූ මෛත්‍රිය ධර්‍මාදි භාවයට නොපමුණුවා වානර සමූහයන් ඒ දුකින් මිදූසේක; තවද මෙසේම එක්ජාතියෙක්හී තුණ්ඩිල නම් හූරුරජක්ව ඉපිද මනුෂ්‍යයන් සධර්‍මනැමති අමෘතයෙන් සන්තර්පනය කෙරෙමින් සෘෂියක්හු මෙන් කියනලද යුක්තිශාස්ත්‍රව හූරුව දෙසූ ධර්‍මය සැටවා දහසක් හවුරුදු පවත්තාවූ නියායෙන් කළසේක; තවද එක්සමයෙක්හි අසමධුරවූ විධුරයයි යන නමින් ප්‍රසිද්ධව–

පච්චත්ථිකං පුණ්ණකයක්ඛ මුග්ගං
මනිසීකං කාමගුණෙසු ගිද්ධං,
යො තික්ඛ පඤ්ඤො විධුරාභිධානො
දමෙසි කාලා ගිරිමත්ථකම්හි.

යනුහෙයින් කියනලද මහා ඍද්ධි ඇති දරුණුවූ කාමගුණයෙහි ලොල්වූ පූර්ණභද්‍ර නම් යක්‍ෂ සේනාධිපතිහු විසින් ඉඳිපත් නුවර ධනංජය කෞරව්‍ය රජ්ජුරුවන් හා කැටිව ද්‍යූතක්‍රීඩා කොට දිනූ කල්හි ඒ රජහු කැටිව තකී කොට විධුරපණ්ඩිතයන්ම උවමැණවැයි යනාදීන් කියා පණ්ඩිතයන්වහන්සේ ලැබගෙණ–

අසමත්‍ථිනොව ගණ්හාහි ආජානීයස්ස වාලධිං,
ඉදං පච්ඡිමකං තුය්හං ජීවලොකස්ස දස්සනං" යි.

යනාදීන් කියනලද තමාගේ සෘද්ධ්‍යනුභාවයෙන් සචින්ධවයාගේ වාලධිය අල්වාගණුවයි මේ මනුෂ්‍ය ලෝකය තොපට පශ්චිම දර්‍ශණය හෙවත් කෙළවර දැක්මයයි කියා භයගන්වා සැටයොදුන් කාලාගිරිපර්‍වත මස්තකයට නැගෙමින් දෙපය උඩුහුරු කොට අල්වාගෙණ පර්‍වතප්‍රාන්තයෙහි එලනකල්හිත් මරණ භයින් තැතිගැන්මක් නැතිව දූෂ්‍ය නැමති යක්‍ෂයා කරණකොටගෙණ පර්‍වතයෙහි උස සැට යොදුනෙකැයි නුව

ශ්‍රී ලංකා ජාතික පුස්

ණින් පිරිසිඳ දූනගෙණ දෙවෙනිව ඕහට සාධුනරධර්මය කියා දිවිලැබ ඔහුගේ මනදෙල පුර ඉඳිපත්නුවරටම පැමිනිසේක; නවද එක්සමයෙක්හි වවුව ඉපද උතුම්වූ ප්‍රඥ ඇතිසේක් අටනොගත් පක්‍ෂපත්‍රයන් ඇතිවූ කැදැල්ලෙක්හි ඔත්කල්හි දිලියෙන්නාවූ වන්හිජලාවෙතින් ලැව් ගිනි ගත්කල්හිත් තමන්වහන්සේ හා කැවිම ජාතියෙහි පුරුදු කොට ආවාවූ මෛත්‍රිය සහිත සත්‍යක්‍රියා බලයෙන් වස්වනලද වර්‍ෂාවක් මෙන් වනය දවාගෙණ එන්නාවූ වන්හිය පසුබස්වා ඒවනප්‍රදෙශයට ගින්නෙන් පීඩාවක් නොවනලෙසට–

සන්තිපක්ඛා අපත්තා සන්ති පාද අවඤ්චනා,
මාතාපිතාච නික්ඛන්තා ජාතවේද පටික්කම ” යි.

යනාදීන් අධිෂ්ඨාන කළසේක; නවද එක්සමයෙක්හි මච්ඡජාතියෙක්හි ඉපද වැසිනැතිව පිපාසයෙන් පීඩිතව ඝර්මයෙන් තපනවූ මත්ස්‍ය සමූහයා දැක–

“ අභිත්ථනය පජ්ජුන්න නිධිං කාකස්ස නාසය,
කාකං සොකාය රන්ධෙහි මචසොකා පමොචය ” යි.

යනාදීන් තමන්වහන්සේ හා කැවිවම බොහෝ දවසක් පුරුදු කොට ගෙණආවාවූ සත්‍ය වචනයෙන්ම සත්‍යක්‍රියා කොට මද ඇසිල්ලකින්ම දැසඳල්වා ආකාශය බැළී ක්‍ෂණයෙහිම සුවච ක්කරු ගැත්තක්හු ලවා පැන්කලයක් ගෙන්වාගෙණ සලන්නාක්හු මෙන් මහත්වූ වර්‍ෂාධාරාවන් වස්වා සත්වයන්ගේ ග්‍රීෂ්ම පරිලාහ මුද සත්වයා සන්තොෂකරවා වදාළ සේක–නවද කෙලවර වෙසතුරු නම් රජව–

කම්පයිත්වා මහිං දෙන්තො සුතෙචාපිසකාඞ්ගනා යි.

යනුහෙයින් දෙලක්‍ෂ සනළිස්දහසක් යොදුන් ඝණකඩ මහ පොළෝපොළොව කම්පාකරවා සඩ්බශිලාප්‍රවාලාදී නවවිධ රත්නයන්ද නැගෙණ හස්තිවාහනයද යාචකයන්ට දන්දී ප්‍රෙමණීයවූ මද්‍රිදේවීන්ද ජාලිය කෘෂ්ණජිනා නම්වූ දරුදෙදෙනාද ගෙණ හිමවුවට ප්‍රවිෂ්ටව වඞ්කගිරි පර්වත ප්‍රාන්තයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ නියොගයෙන් විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින් නිර්මිත කොට පානාලද එක් පෙදෙස් මග හා තවුස් පිරිකර සහිත පර්ණශාලාව දැක එහි ප්‍රවිෂ්ටව තපස්කිරිමෙහි ඊප්සිත කෙනෙකුන්ට මෙකියන සියල්ල කැපයයි අකුරු අඟුරෙන් බිත්තියෙහි ඇඳතුබූවා බලා සමාධිව තවුස් වෙස් ගෙණ වනහර වනමුල් අනුභව කොට ක්‍රමයෙන් දවස් යවා තපො සංරක්‍ෂණය කරමින් සිටිකල්හි සම්පස්ථාන ප්‍රාප්තවූ ජූජක බ්‍රාහ්මණයාහට හණස්සාදක කොට දරු දෙදෙනා දන්දී නවද සිවුසැටක් ස්ත්‍රීලක්‍ෂණයෙන් විරාජමානවූ මද්‍රිදෙවීන්ද ඉල්වා ආ ශක්‍රබ්‍රාහ්මණයා හට දන්දී පාරමී ධර්මයන් පූරණය කොට සර්වඥතාඥනාය සමධිගමය කළසේක්ද–

" මුචලින්දාදයො නාගා ධනපාලාදි කුඤ්ජරා,
බ්‍රාහ්මණා කූටදන්තාදී බිම්බිසාරාදි ඛත්තියා.
සච්චකාදි පරිබ්බාජා ජටිලා කස්සපාදිකා,
ආලවකාදිකා යක්ඛා පහාරාදාදි දානවා.
පුරින්දාදයො දෙවා බ්‍රහ්මාණො ච බකාදයො,
අදණ්ඩෙන අසත්ථෙන ඤාණෙන දමථං ගතා " යි.

යනුහෙයින් යථොක්තප්‍රකාරවූ මේ සත්ත්වයන්ද ක්ෂත්‍රියබ්‍රාහ්මණවෛශ්‍ය ශුද්‍ර යනාදිවූ සත්ත්වයන්ද අදණ්ඩ අශස්ත්‍රයෙන් දමණයෙහි ලා, ශාසනයෙහි මනණ කොට අමානුසිකවූ ධර්ම්මාමෘත පානයකරවමින් ත්‍රිවිද්‍යාදිවූ සෘද්ධි වික්‍රමයටද පමුණුවා යම් සර්වඥරාජොත්තමයාන කෙනෙකුන්වහන්සේ සත්ත්වයන් සංසාරසාගරයෙන් තරණය කළසේක්ද—ඒ අප්‍රතිපුද්ගලවූ අනන්ත කරුණාකරවූ මහාකාරුණිකවූ ප්‍රඥා නිධානවූ ශාක්‍යවංශාවතංශකවූ මාරභයඞ්කරවූ සර්ව්ව ප්‍රියඞ්කරවූ ලොක ශිවංකරවූ පාපභයඞ්කරවූ සර්වඥ දිවාකරවූ—

මුනි රාජ වරෙ නර රාජවරෙ
දිවි දෙව වරෙ සුචි බ්‍රහ්මවරෙ,
සක පාප හරෙ පර පාප හරෙ
සක බුද්ධි කරෙ පර බුද්ධි කරෙ.

යනාදීන් වර්ණ්ණණීයවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේගේ ශ්‍රීමුඛ නමැති තාමරසගර්භයෙහි සුප්‍රතිෂ්ඨිතවූ ශ්‍රීදන්තධාතු කෙනෙකුන්වහන් සේ වීනම් මාවිසින් කියනලද මේ සත්‍යවචනය හේතුකොටගෙණ නීල වලාහකගර්භයක් විවෘත කොට ගෙණ පැනනැගි චන්ද්‍රරේඛාවක් මෙන් කිණිහිරින් ආකාශතලයට වහා පැනනැගී අභිධවල සඳරැසින් උදාවූ කිරිසයුර මෙන් සුදුවූ බුදුරැස් විහිදුවමින් සියලු සත්ත්වයා නන්දනය කරමින් ප්‍රාතිහාර්‍ය්‍ය පවත්වා වදාළමැනවැයි ආරාධනා කළකල්හී—

තස්මිං ඛණෙ සා ජිනදන්ත ධාතු
නභං සමුග්ගම්මපභාසයන්තී
සබ්බාදිසා ඔසධි තාරකාව
ජනප්පසාදෙසි විහිණ්ණකංඛං.
අථො තරිත්වා ගගණඞ්ගණම්හා
සා මත්ථකෙ සෙඨිසුතස්ස තස්ස,
පතිඨ්ඨිත්වානසුධාභිසිත්ත
ගත්තං'ව නං පීණයි හත්ථි නින්නං.

යට කියනලද ක්‍රමයෙන් ඒ දළදාවහන්සේ වහා ආකාශතලයට පැන නැගී ඖෂධි තාරකාවක් මෙන් සියලු දශදිගුන් බබුලුවනසේක් සත්ත්වයා

සිත හටගත් කාංසා විනෝදනය කරණයෙක් ප්‍රාතිහාර්‍ය දක්වා ඒ සිටු පුත්‍රයාගේ සිරසෙහි පිහිටාගෙණ ආදරයෙන් නැමුනාවූ ඔහු අමාන පරෂෙක කරණලද ගාත්‍රා ඇත්තක්හු මෙන් පිණවූසේක.

ඉක්බිත්තෙන් අපායගාමිවූ ලබ්ධිගත් දුබුදුවූසත්වයන් විසින් නිශ්‍රිතවූ අචෙලකාදීන් විසින් පුරනනයේ ගණ්ඩම්බ රුක්මුල්හි බුදුන් සම සමව ප්‍රාතිහාර්‍ය කරම්හයි සපථ කොට අවුත් සිට—

අඹඇටින් බැටලදින් නොසතුටින් නොසිරිමින් ගෙලෙහි බැඳි කල කටින් උකණලද පැන්කටින් එද ඒ ගංනොටින් දියෙහි ගී ගැලිගැලි.

යටගගට පැමිනා ජන්මාන්තරගතවූ නිගණ්ඨ ආචාරිවරයන් විසිනුත් ප්‍රාතිහාර්‍ය පාම්හයි බොහෝ ව්‍යසනයට පැමිණියාවූ නිල්ලජ්ජවූ අචෙලකයන්ගේ අනියානුගතවූ බ්‍රෂ්ටවූ දෘෂ්ටිගත් මේ නිවටුන්ගෙන් සමහර අයෙක් රජ්ජුරුවන් ලඟට ගොස් කියන්නාහු දෙවයෙනි මේ ප්‍රාතිහාර්‍යනම් ඒකාන්තයෙන්ම ධාතුන්වහන්සේගේ ප්‍රාතිහාර්‍යයෙන් නොවෙයි ඒ ශ්‍රෙෂ්ඨිපුත්‍රයාගේ විද්‍යාමහිමයෙකැයි කීකල්හි ඒ පණ්ඩුවාස රජතෙම සුභද්‍ර නම් ශ්‍රෙෂ්ඨිපුත්‍රයා ලඟට කැඳවා කියන්නේ එම්බා ශ්‍රෙෂ්ඨිපුත්‍රයාණෙනි මේ දක්කවූ ප්‍රාතිහාර්‍ය දන්තධාතුමහිමයෙක් නොවෙයි මේ අචෙලකාදීහු කියති එසේ හෙයින් අනික් ප්‍රාතිහාර්‍යයක් දක්වන්ට උවමැනවැයි කී කල්හි යහපත ස්වාමිනි කියා ගිවිස ස්වර්ණ පාත්‍රයෙක්හි සුවඳකැවූ සිහිල් පැන් පුර ශ්‍රීදන්තධාතූන්වහන්සේ ඒ පාත්‍රයෙහි සුගන්ධ ජලයට වැඩූ කල්හි දක්ෂිණාවෘත්ත කොට රාජහංස ධේනුවක් මෙන් ශීඝ්‍රව දුවනාසේක් එමදියෙහි ගැලෙනාසේක් එම දියපිට වඩනාසේක් සියලු සත්වයන්ගේ නෙත්‍රයෙහි සතුටු කඳුළු ගන්වමින් ප්‍රාතිහාර්‍ය කල කල්හි ඉක්බිත්තෙන් නොහොත් එකල්හි කරණලද ඍද්ධිප්‍රාතිහාර්‍යයෙහි ප්‍රසන්නතාවයක් නැතිව විශ්ම්බ්‍යයෙහි වලක් ගස්වා ඒ වලෙහි දළදාවහන්සේ ලවමින් පසියම් කොට ඇතුන් ලවා මැඩවූ කල්හි—

හෙඨා මහිං උඨහි චක්කමත්තං
විරාජමානං මණිකණ්ණිකාය,
පභස්සරං රූපිය කෙසරෙහි
සරොරුහං කඤ්චන පත්ත පාලිං.

යනුහෙයින් රථසකක් සා පමණ මහතඇති මැණික්මයවූ කෙමියකින් බබලන්නාවූ රන්වන් පෙති පඞ්ක්ති ඇති පෘථිවිය පලාගෙණ පැනනැගාවූ පියුම් මත්තෙහි වැඩහිඳ සොභාවෙන් දශදිගුන් බබුළුවන්නාවූ ඒ දළදාවහන්සේ මද ඇසිල්ලකින් දක්නාලද සත්වයො නමනමන් පලන් වස්ත්‍රාභරණාදිය දම්මෙන්ද නොයෙක් මල්වරුෂා වැස්වීමෙන්ද පැන පැන අත් පොලන අත්පොලසනින්ද ඔල්වරහඬ ගැසීමෙන්ද සාධුකාර

දිම් ආදිවූ කෝලාහලයෙන්ද ඒනුවර පිරුණාක්මෙන් කළහ. ඉක්බිති තවද ඒ තිත්ථිකයෝ ප්‍රාතිහාර්‍ය්‍ය චක්ෂුප්‍රයෝගයෙකැයි කියා ගිම්සවා නොයෙක් කුණපාදියෙන් පිරුණාවූ දුටු ක්‍ෂණයෙහි පිළිකුල් එලවන්නාවූ පවුරෙන් පිටත අගලට දැමූකල්හි ඒ අගලමැද ඇසිල්ලකින්ම රක්තපද්ම සෙවතපද්මයයි කියනලද පංචවිධ පද්මයන් විසින් ගැවසෙනලද හංශසමූහයා විසින් අනුභවකරණලද්දාවූ පොකුරුණියෙන්ද ඹමර සමූහයන්ගේ සිත්කළුවූ නාදඇත්තාවූ ඒ පුෂ්කරණිය නන්දානම් පුෂ්කරණිය මෙන් වූකල්හි දහස්ගණන් ඇත් අස්ආදීන්ගේ කුඤ්චනාද හෙෂාරවයෙන්ද මනුෂ්‍යයන්ගේ ඔල්වරහඬ ගැසීමෙන්ද නොයෙක් භෙරිනාදජාතීන්ගේ මනාකොට වයනලද ඝොෂාවෙන්ද නොයෙක් සත්වයන් විසින් නොයෙක් සතුති ප්‍රකාශකොට කියනලද ගීතිකාවෙන්ද නොහොත් ලැජ්ජා ඇත්තවුන් විසින් නටනලද නෘත්‍ය ගීතිකායෙන්ද ඉස බඳනාලද පිළි සියදහස් ගණනින්ද ඔදුහි සිතින් අපොලන අසුරුසනින්ද නානා ස්ථානයෙහි ලනලද සඳුන් කපුරු කස්තුරු අගරු දෙව්දුරු කළුවැල් ආදීන් ලනලද සුවඳදුම්න්ද මෙඝයක්සේම ආකාශ කුහරය වසන්නාක් මෙන්ද එකල්හි නගනලද නොයෙක් ධජපතාක මාලාවෙන්ද ඒ සියලු නුවර වසනලද කලක් මෙන් වූ කල්හි සිතිය නොහැක්කාවූ ආශ්චර්‍ය්‍ය දැක සතුටුවූ අමාත්‍ය ගණයා වැඩෙහි යොදනුපිණිස පඩුවාසරජහට කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මෙබඳු විශෙෂ ඇත්තාවූ සම්‍යක්සම්බුද්ධ සර්‍වඥරාජොත්තමයානන් වහන්සේගේ සෘද්ධිමහිමය දැකදැකත් චිත්තප්‍රශාද මාත්‍රයකුත් නොකරන්නේ වීනම් ඔහුගේ නුවණින් ප්‍රයොජනයෙක් නම් ඇද්ද—

පසාදනීයෙසු ගුණෙසු රජ
පසාදනං සාධු ජනස්ස ධම්මො,
පුප්ඵන්ති සබ්බෙ සයමෙව චන්දෙ
සමුග්ගතෙ කොමුද කානනානි.

යනුහෙයින් රජ්ජුරුවන්වහන්ස ප්‍රශාද කටයුතුවූ ගුණයෙහි පැහැදගැන්මනම් සත්පුරුෂයන්ගේ සවභාවධර්‍මයෙක එක්කෙණෙකුන් විසින් කරණකියන දෙයක් නොවෙයි එක්කෙනෙකුන්ගේ උත්සාහයක් නැතිව සවභාවයෙන් වන දෙයෙක් ඇද්දැයි යනහොත් මේලොකයෙහි මෙබඳු ආශ්චර්‍ය්‍යමත් ප්‍රාතිහාර්‍ය්‍ය දැකදැක බුද්ධාදි රත්නත්‍රයෙහි ප්‍රශාදයක් නොකොට අනාචාරසවරූප ඇති මේ නිවටුන්ගේ බස්ගෙණ නුඹවහන්සේ කරන්නේ කවර කාර්‍ය්‍යයෙක්දැයි සීතයෙන් පීඩිතවූ සත්වකෙණෙක් ඒ පීඩා සන්හිඳුවම්හයි ගිනි තබා කදෙපැනියන් ඈරගෙණ යම්සේ පිඹ ගින්නෙන් සම්පාදනය වන්නාවූ කටයුත්ත කදෙ, පැනියන් නිසා සිඹවේද ? එපරිද්දෙන් මේ දුල්ලබ්ධි ගත් නිවටුන්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

නිසා අපායභාක් වීමට කාරණා විනා ස්වර්ගමොක්ෂ සම්පත් සිද්ධවන තරම් ප්‍රයොජනයෙක් ඒකාන්තයෙන් නැත්තේය තවද මේ ලොකයෙහි චන්ද්‍රසූර්‍ය්‍යයී දෙදෙනා විසින් පතුරවන්නාවූ ආලොක විනා සිය දහස් ගණන් කද්‍යොතයන් ඇරගෙණ සම්සේ ලොව පහලවූ අඳුරු හැරගත නොහැක්කායේ–තවද මුක්තාහාරයකින් සැරහුන මනාකෙනෙකුන් මුක්තාහාරයෙන් සරනත්මුත් විෂඝොර සර්පාහාරයකින් ග්‍රීවය සරහන කල්හි මරණ හෝ මරණසමාන දුඃඛයට හෝ පැමිණේද එහෙයින් නුබවහන්සේ වැනි උත්තම රජදරුවන් විසින් භජනය කලමනා නම් ස්වර්ගමොක්ෂ සම්පත් සාධාදෙන්නාවූ රත්නත්‍රයම ප්‍රශාද විනා සෙසු දුශ්ශීලාබිඩියෙහි යෙදෙන ගමනනම් සප්තරත්න භූමියට අවතීර්ණව අඟුරු පොදි බඳිනලුන් වැන්න–එසේහෙයින් දෙවයන්වහන්ස නුබවහන්සේ වැනිවූ උත්තමයන් විසින් භජනය කලමනානම් බුද්ධාදි රත්නත්‍රයමය එබැවින් දානශීලාදිවූ සුචරිතයෙහි යෙදි වසනබව සුද්ධසුයයි යනාදීන් මුඛනොසැහෙන පරිද්දෙන් වෙනවෙනම ඔවාතෙපුල් කියා ඒරජහු සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටවූ කල්හි රත්නත්‍රය ප්‍රශාදී රජහු විසින් එකහින් සලුව ගෙණ ඒ අගලසමීපයට වහා ගොස් පියුමෙන් පියුමට යන්නාවූ හංශධෙනුවක් මෙන් ඒ ශ්‍රීදන්තධාතුන්වහන්සේ චන්ද්‍රමරීචිය කට බඳුවූ ධවලප්‍රභායෙන් එකපැහැර ආලොක කෙරෙමින් ප්‍රාතිහාර්‍ය්‍යයී පෑ කල්හි ප්‍රීතියෙන් පිනා දෙහොත් මුදුනෙහි තබාගෙණ ඵලභරිත කදලිස්කන්ධයක්සේ නැමී පරමාදර පූරිතව දන්වනුයේ–

වොහාරදක්ඛා මනුජාමුනින්‍ද
සඞ්ඝට්ටයිත්වා නිකසො පලම්හි,
කරොන්ති අග්ඝං වර කඤ්චනස්ස
එසොහි ධම්මො චරිතො පුරාණො.

මණිප්පසන්නාකර සම්භවම්පි
හුතාස කම්මෙහි සඞ්ඛරිත්වා,
පාපෙන්ති රාජඤ්ඤ කිරීට කොටි
විභූසනත්තං විදුනො මනුස්සා.

විමංසනත්ථාය තව'ජ්ඣනාපි
මයාකතංසබ්බමිදං මුනින්‍ද,
ආගුං මහන්තං ඛම භූරිපඤ්ඤ
ඛිප්පංමමාලං කුරු උත්තමඞ්ගං.

යනාදීන් ඒ රජහු විසින් ස්වාමීනි මා විසින් කරණලද ඒ අපරාධය ක්ෂමා කොට වදාලමැනව මම ඒ කෙලේ අනාදරයෙකැයි නොසිතම් මේ ලොකයෙහි නුවනැත්තාවූ සත්‍වයෝ රත්නෙහි අගය වලනු නිසා

නහස්නා පහණෙති සඞ්ණය කොට ආයාස පමුණුවා උත්තමාඞම බව් දූතගණින් තවද මේ ලොකයෙහි සත්වයෝ අනර්ඝ මැණිකක් තමන්ගේ හස්තප්‍රාප්තවූ කල්හි ගින්නෙහි බහා ගිනිවර කිරීමෙන් කිරීටාග්‍රයෙහි හෙවත් ඔටුනුඅගපමුණුවා පලඳිති එසේහෙයින් මාගේ සර්වඥදන්තධාතූන් වහන්ස මාවිසිනුද නුඹවහන්සේගේ සාධ්‍යානුභාව ප්‍රකාශකරනුපිණිස යථොක්ත ක්‍රමයෙන් පරීක්ෂාකලබවවිනා නුඹවහන්සේට අනාදර පිණිස නොකෙළෙම් එසේ හෙයින් මාකෙරෙහි කරණලද කරුණායෙක් ඇත්නම් මාගේ උත්තමාඞ්ගයට වැඩවදාළ මැනවැයි ආරාධනාකල ක්ෂණයෙහි ආකාශයට පැනනැගී චන්ද්‍රරේඛාවක්සේ සුභ්‍රරැස් විහිදුවමින් ඒ පඩුවාසරජහු මුදුනෙහි පිහිටිසේක. එවේලෙහි පස්වණක් ප්‍රීතින්පිනා මහපෙලහරින් ශ්‍රී දන්තධාතූන්වහන්සේ තමන්ගේ උත්තමාංගයෙන් හෙවත් හිස්මුදුනෙන් පිළිගෙණ නුවර ප්‍රදක්ෂිණාකොට නොයෙක් පුෂ්ප සුගන්ධජාතියෙන් සරහා පිළියෙලකරණලද පුරයට දන්තධාතූන් වහන්සේ වඩාගෙණ ගොස් තන්වනලද ධවලච්ඡත්‍රඇති විසිතුරුකොට සරහා නිමවනලද සිංහාශනයටවඩා නවරුවන්ආදින් පූජාකොට; අනෙකප්‍රකාරවූ රත්නයෙන් උජ්වලිතවූ දහසක් රැසින් බබලන්නාවූ සූර්‍යමණ්ඩලයමෙන් අනෙකප්‍රකාර සවර්ණ කිංකිණික ජාලාදි නොයෙක් වර්ණයෙන්ද ඒ ඒ ස්ථානයෙහි එල්වනලද මාහැඟිවූ මුතුදැලින්දැයියනාදිවූ නොයෙක් අලඞ්කාරයෙන් සරහා පිළියෙළ කරණලද විසිතුරුවූ රුවන්දළදාගෙයි පනවනලද සර්වර්ණපීඨයටවඩා අචලශ්‍රද්ධායෙන් පිහිටා ගුහසීව රජ්ජුරුවන් අභිවිශ්වාසකොට තමන්ගා සමබවවටතබා තමන්ගේසියළු නුවර දෙව්පුරයක්මෙන්සරහා රාජ්‍යපුද බොහෝ කුසල සම්භාරයන් රැස්කොට දවස්යවනකල්හි, ක්ෂීරධාරනම් රජ්ජුරු කෙනෙක් තමන්ගේ බාහුශක්තියෙන් සතුරන්ගේ එබිදඑීමඩනාවූ හස්තිසේනාවය අශ්වසේනාවය රථසේනාවය පාබලසේනාවයයි යනාදිවූ චතුරංගිනිසේනාව පිරිවරා මාම්ස අන්රජක්හු කිත්දැයි යන රජාභිමානය ඇතිව ඒරජතෙම දන්තධාතූන් වහන්සේ ගන්නාපිණිස යුධයටසැරහී පැළලුප්නුවර සමීපයට ගොස් දූතයන්ලඟටකැඳවා කියන්නේ එම්බාසගයෙනි පඩුවස් රජහුගේ නුවරට ගොස් කියනකල අපගේ ක්ෂීරධාර රජ්ජුරුවන්වහන්සේ දළදා සාමීන් නිසා චතුරංගිනීසේනාව ඇරගෙණ නුවර සමීපයට ආසේකැයි කියව කුමක්නිසා ආසේක්දැයි කීකල ශ්‍රීදන්තධාතූන්වහන්සේ ගුණයෙන්දෙනොත්දුනමැනව එසේනොදෙනසේක්වීනම් බලයෙන් වීනමුත්ගන්නාසේකැයි කියව යනාදීන් හසුන්දී ඔවුන් රජු සමීපයටයැවූ කල්හි ක්ෂීරධාර රජ්ජුරුවන්ගෙන් ගිය දූතයා කීබස්ඇසූ පඩුවාසරජ කියන්නේ මේසටන් කියා ආ තාගේ මුඛයෙහි මහනොල් මල් පිජේවයි යනසතුටුවූ වදන් කියමින් යුධයෙහි සතුටුසිත් ඇතිව කියන්නේ ශ්‍රී දන්තධාතූන්වහන්සේ නොදෙම්මය නොප රජුහා යුධකෙරෙම් එබැවින් දූත්ම

ගොස්. තොපගේ රජුට කියවයි ඒදූතයාඅත කියා යැවූකල්හි ඒක්ෂීරධාර රජහුවිසින් පඬුවස්රජ කියනලද වහසිතෙපුල් අසමින් සිතහටගත් රාජාභිමානයෙන් එඩිදැපී යුධාර්ථී පඬුවස් රජහුගේ නුවරට පැමිණිකල්හි ඒ පඬුවස් රජතෙම තමාගේපුර නැමති ගුහාචාරයෙහි හෙවත් ඇතුළුපුරයට ප්‍රාප්තවූ ඇත්රජෙකු බඳුවූ ඒක්ෂීරධාරරජුදැක කේසරසිංහරාජයෙකුසේ නිර්භයවූ සිත්ඇතිව තමාගේ ඇත්සෙනඟ අස්සෙනඟ රථසෙනඟ පාබලසෙනඟය යන චතුරංගිනි සේනාවෙන් යුක්තව මහත්වූ රණරඟ ඝොෂායෙන්යුක්තව එවිට–

උදිත බහල ධූලි පාළි රුඬතනලිකොඛා
සමද විවිධ යොධා රව සංරමභ භීමෙ
නිසිත සරස තාලී වසසධාරා කරාලෙ
අජිනි මහති යුධෙ පණ්ඩුකොඛිර ධාරං

යනාදීන් ඒපඬුවස්රජතෙම තමාගේ චතුරංගිනි සේනාවගේ පාදක්ෂීණයෙන් නැගාවූ රජස්සමූහයෙන් ආකාශ කුහරය වසමින් ඒක්ෂීරධාර රජහුකරා පැමිණි පුරුෂමදයෙන් මත්වූ යෝධභටයන්ගේ වහසිබස්නැමති ගර්ජනාවෙන් භයඞ්කරවූ ශරප්‍රහාරආදිවූ අයුධවෂීාවන්ගෙන් ගැවසී ගත්නාවූ මහත්වූයුධයෙන් ඒක්ෂීරධාරනාම් රජහු පරාජයකොට මහත්වූ රාජ ඍද්ධිඇති ශ්‍රීවිලාසයෙන් නුවරටවැද සේනාවට බොහෝ සංග්‍රහකොට තමන්ගේපුතනුවන්ට රාජ්‍යාභිෂේකකොට රාජ්‍ය පරිපාලනය ඔහුඅත තබා ශ්‍රීදන්තධාතූන්වහන්සේ දෙවෙනිව ගුහසීවරජහට පාවාදී ඔහට බොහෝ සත්කාරසංග්‍රහකොට සියනුවරට යවා තුමූද බොහෝවස්තු දානමුඛයෙහි පරිත්‍යාග කොට පැවිදිව තමන්ගේ මඟුලුයනෙහි දවස්යවා කරණලද සුචරිතබලයෙන් එයින්චුතව තවුතිසා භවනයෙහි උපන්හ—ගුහසීව රජ්ජුරුවෝ ඒපඬුවස් මහරජහු අතින් ලබණලද ශ්‍රීදන්තධාතූන් වහන්සේ තමන්ගේනුවරට මහත්පෙළහරින් වඩාගෙණගොස් සඵනරත් නාමයවූ ධාතුමන්දිරයෙහි නත්විසිතුරු .කර්මාන්තකොට තත්වනලද බව ලාන පත්‍රයෙන් විරාජමානවූ සවර්ණමය පිඨමස්තකයෙහි ශ්‍රීදත්තධාතූන් වහන්සේ වඩා නුවරටවන් සද්දවසින් ඇතුලතමහත්වූ පූජාපවත්වමින් පෙර තරමට දිවුනක්ව සුචරිතපවත්වමින් උන්කල්හි—උදෙනීරට උදෙනී රජහුගේ පුත්‍රවූ දන්තනාම් කුමාරයෙක් ලදරු වයසෙහිපටන් පුරුදුකරණ ලද බහුල ශ්‍රද්ධාඇතිව දසබලධාරීවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේගේ දන්තප්‍රණාමයෙහි පුරනවූ සිත්ඇතිව තමාගේ සියනුවරින් අවුත් කලිඟු රටටපැමිනරජ්ජුරුවන්කෙරෙහි ප්‍රශනභාවවසන ඒරාජකුමාරතෙම දළදා වහන්සේට අනේකප්‍රකාරවූ පූජාපවත්වා එමනුවර සැපසේවසනකල්හි ගුහසීවරජහු විසින්—මොනවට සුපුෂ්පිතවූ නිලිපුල්පෙති දෙකක් හා සාදෘශයවූ ඇස්සඟලක්ධරනනාවූ හංශධෙනුවකට බඳුවූ සළෙලු ජනනාමැති

භෘඞ්ගසමූහයන්ගේ සිත්සනහනලද මුඛනැමැති පද්මයෙන් විරාජමානවූ මනොඥවූ ධම්මිල්ල කලාපයක්ඇති පයොධරයුග්මයකින් නමනවූ ශරීර ඇති රුවින් අග්‍රප්‍රාප්තවූ හෙමමාලායයි යන නමින් ප්‍රසිද්ධවූ තමන්ගේ දියණි යන් සියළු ගුණානුවණින් යුක්තවූ නිර්මල රාජකුලයෙහි උපන්නාවූ බන්ධුත්ව යට සුදුසුවූ ඒදන්තකුමාරයන්ට පාවාදී දහස්ගණන් දාසිදාස් ගව්මහිෂාදීවූ දායාදදී තමන්හාසරිතනතුරටතකා දළදාවහන්සේගේ ආරක්ෂාධුරයද පාවාදී උන්කල්හි ක්ෂීරධාර රජ්ජුරුවන්ගේ බෑනානුවෝ දෙදෙනෙක් මහත්වූ චතුරංගිනිසේනාවවිසින් පිරිවරණලදුව ශ්‍රීදන්තධාතූන්වහන්සේ කෙරෙහිකරණලද ලොභයෙන් යුඬසරසාගෙණ කලිඟුපුරසමීපයටඅවුත් කඳයුරුබැඳ එහිරඳා දූතයන්අත කියා යවන්නාහු දාඨාධාතූන්වහන්සේ ලබණඅභිප්‍රාඇත්තම්හ, එසේහෙයින් ඒදාඨාධාතූන්වහන්සේහෝ එවත් නේය නැතහොත් කීර්තිශ්‍රී උපදවන යුඬහෝ අපහාකැමිව කරන්නේය යනාදීන් අසන්ටකකීශවූ අස්නාක්එවූකල්හි ගුහසීවනම් රජතෙම තම හටඑවනලද හසුන්අසා බෑනානුවන් ලඟටකැඳවා රහස්කොටකියන්නාහු එම්බාදන්තකුමාරයෙනි සටනටගියකල්හි දිනුම් පැරදුම් නොදතහැක්ක ඉදින් මම මාගේ ප්‍රාණයඇතිව තිබියදී මාගේ ශ්‍රී දන්තධාතූන්වහන්සේ අනික්කෙනෙකුන්ටනොදෙම්මය සටනට ගියකල්හි ඉදින් පරාජයෙක්වී නම් සියළු දෙව් මිනිසුන් විසින් පුදනලද ශ්‍රීදන්තධාතූන්වහන්සේ ඇර ගෙණ බ්‍රාහ්මණවේශයෙන් යුක්තව සිංහලද්වීපයට යවයි මයිල්රජහුවිසින් කියනලද උදාරවූ බස්අසා ඒ දන්තකුමාරයෝ මයිල්රජහටකියන්නාහු—

තවච මමච කොවා සීහලෙ බන්ධුභූතො
ජිනචරණ සරොජෙ භත්තියුත්තොච කොවා,
ජලනිධි පරතීරෙ සීහලං බුද්ධ දීපං
කථ මහමහි නෙස්සං දන්තධාතුං ජිනස්ස.

යනාදීන්කියමින් සිංහලද්වීපයට යනලෙස නුඹවහන්සේ වදාරණසේක එසිංහලද්වීපයෙහි නුඹවහන්සේටද මටද බන්ධුත්වයෙක් හෙවත් නෑකෙනෙක්ඇද්ද; බුදුන්ගේ ශ්‍රීපාද පද්මයට ආදරයෙන් යුක්තයෝ කවුරුද; මහාසාගරයෙන් එතරතිබෙන්නාවූ ක්ෂුද්‍රවූ සිංහලද්වීපයට බුදුන්ගේ ශ්‍රීදන්තධාතූන්වහන්සේ කෙසේ ගෙණයමෝදැයි කීකල්හි ඒ ගුහසිව රජ්ජුරුවෝ තමන්බෑනවූ දන්තකුමාරයන්ට මෙසේකීහ—

මමච පිය සහායො සො මහාසෙන රාජා
ජිනචරණ සරොජ මඤ්ජසෙවාභි යුත්තො
සලිල මපිච ප්‍රුෂ්ං ධාතුයා පත්ථයන්තො
විවිධ රතන ජාතං පාභතං පෙසයිත්ථ.

යනාදීන් එම්බා දන්තකුමාරයෙනි දසබලධාරීවූ සර්වඥරාජෝත්තමයාණන්
වහන්සේගේ ධාතූන්වහන්සේ සිංහලද්වීපයෙහි බොහෝවම පිහිටියේය.
එසේහෙයින් ඒසිංහලද්වීපයෙහි සසර බියනැසීමට දක්ෂවූ ඒසර්වඥයන්
වහන්සේවිසින් දෙසනාකරණලද්දාවූ සපර්‍යාප්තික නවලොකොත්තර
ශ්‍රීසද්ධර්මයද එහිමපවත්නේය නවදබුදුන්ගේ නවාඞ්ග ශාස්තෘශාසනයත්
එහිමපවත්නේය අගණ්‍ය සඞ්ඝයාවහන්සේද වසනසේකැයි යනාදීන්
කියා නවද තොපට ශ්‍රී ලඞ්කාද්වීපයෙහි සහායඇතැයිකියනලද ගුහසීව
රජතෙම එම්බාදන්තකුමාරයෙනි ඒසිංහලද්වීපයෙහි මහාසේනනාම් රජ්ජුරු
කෙනෙක්ඇත ඒරජ්ජුරුවෝ මට අභිසයින්ඉෂ්ටමිත්‍රයෝය නවද උන්විසි
නුත් පළමුත් මාසම්පයට ශ්‍රීදන්තධාතූන්වහන්සේ ඉල්වා ඇතුත් අසුන්
මුතුමැණික් ආදිවූ අනෙකප්‍රකාරවූප්‍රාභෘර්ති එවනලද එසේහෙයින් ප්‍රඥා
සම්පන්නවූ මහාසේනනාම්රජහුවිසින් ශ්‍රීදන්තධාතූන්වහන්සේ පුදන්නට
පොහොසනැයි පුරුදුරවින් වෙන්වූ තොපට නොයෙක් වස්තුදීමෙන්
සංග්‍රහකරන්නට සමර්ථයෝයයි යනාදීන් තමාගේ බෑනාවූ දන්තකුමාර
යන්ට මෙසේකියා සේනාව රැස්කරවා ඔවුන්ටවස්තුදී මහත්වූ රණරඟ
ඝොෂායෙන් යුක්තව රණබරණියට ගොස් සතුරුවආවාවූ රාජකුමාර
වරුන්හායුද්ධකලකල්හි තමාගේ මසිල්රජහු මරණමුඛයෙහි පතිතවූවයි
සනුඅසා මසිල්රජහුවිසින් කියනලදක්‍රමයෙන් රජවෙස්හැර බමුණුවෙස්
දරා ශ්‍රීදන්තධාතූන් වහන්සේ ගෙණ කලිඟුපුරයෙන් නික්ම දකුණුදිගට
වහාගොස් දෙවතානුභාවයෙන් අචලසවභාඇති ඉතාමහත්වැලිපිරුනාවූ
ගඟානම්ගඟින්එතරව ධවලවූපුලිනතෙලෙහි වාලුකාරාසියක්කොට එයට
ශ්‍රී දන්තධාතූන්වහන්සේවඩා නැවත ඒකාලිඟපුරයට ගොස් ගන්නාලද
බැමිණිවෙස්ඇති භායසීවද ඒසම්පයට වහාඇරගෙණගොස් ඒවාළුකා
රාශියෙහි පිහිටුවනලද ශ්‍රී දන්තධාතූන්වහන්සේට පූජාකරමින් වනලැහැ
බක් සම්පවසිටියානුය ඔවුන්දෙදෙනාසිටිකල්හි ආකාශයෙන් යන්නාවූ
එක්තෙරකෙනකුන්වහන්සේ ආකාශයෙන් වඩනාඇසිල්ලෙහි වැළිදාගැ
බින් ඝණව නැගෙන්නාවූ අනෙකප්‍රකාරවූරස්මිසමුහයන්දැක ඒස්ථානයට
ආකාශයෙන්බැස ඒවාළුකාද්වීපයවැඳ සිටි තෙරුන්වහන්සේදැක සතුටුවූ
සිත්ඇතිඒදෙදෙනාවිසින් ශ්‍රීදන්තධාතූන්වහන්සේ ඇරගෙණ අපි සිංහල
ද්වීපයට යමහයිකීකල්හි මෙරමාහට හිතකිරීමෙහි ඇළුම්ඇති ඒසර්වඥපුත්‍රවූ
තෙරුන්වහන්සේ දළදාරැකුමෙහි නිරතවූ ඔවුන් දෙදෙනාහට වදාරණ
සේක් ශරීරබෙද ඇත්තාවූ තොප දෙදෙනා විසින් යනලද මාර්ගාන්තර
යෙහි පෙනුනු යම්උපද්‍රවයෙක් ඇත්නම් ඒනිවාරණයපිණිස මා සඳහන්
කරවයි යනාදීන් ඔවුන් දේදෙනා හට කියා නැවත ඔවුන්ට සුදුසු බණ
වදාරා මහත්වූ සොකනැමහිසල්ලය හෘදයෙන්උදුරාහැර තමන්වහන්සේ
ආකාශයට පැණනැගී තමන්වහන්සේවසන්නාවූස්ථානයටම වැඩිකල්හි

ගිංපල්ලේ නාගභවනයෙහිවසන්නාවූ මහත්සෘද්ධිඇති පඬුවාසයයි* යන නාමක් ඇති නාගරාජයෙක් තමාගේ නාගභවනයෙන් නික්ම අභිප්‍රාණුකූලවූ පරිද්දෙන්ඇවිද්නේ දළදාවහන්සේ වැඩහිඳිනාවූ වාළුකාචෛත්‍යයට පැමිණ ඒචෛත්‍යයෙන් නිර්මලවනැගෙන්නාවූ චන්ද්‍රමයූඛයට බඳුවූ රශ්මි සමූහයන්දැක මේකිමෙක්දෝහෝයි සැකවවලත්නේ වැළිදාගැබ මධ්‍යයෙහි පිහිටියාවූ ඒදළදාවහන්සේදැක ඒක්ෂණයෙහි ආදරසහිතව අද්‍රශ්‍යමානාවූශරීරයකින්යුක්තව රත්නමයවූ කරඬුවෙහි වැඩඋන් දළදාවහන්සේ ගැල මහත්වූ ශරීරයක්මවාගෙණ මහමෙර පල්ලෙහි රුවන්වැලිපිට දරණපඩභියෙන් ඉනාඋස්වූ රත්මෙර රුවන්පටකින් වළඳනාක්මෙන් වෙලාගෙණ වැදහොත්කල්හි වැලිරැසමධ්‍යයෙහි තබනලද දළදාවහන්සේ නොදක්නාඒදෙදෙනාවිසින් සර්වඥපුත්‍රවූ උත්තමවූ පරහිතකිරීමෙහිදක්ෂවූ ඒතෙරුන්වහන්සේ සඳහන්කළකල්හි ඔවුන්දෙදෙනා විසින් තමන්වහන්සේ සඳහන්කළබැව්දැන ශොකයෙන් බැගැපත්වූ මුහුණුඇති ඔවුන් දෙදෙනාලගටගොස් ජයම්පතින්විසින් පුදනලද්දාවූ ඒදළදාවහන්සේතබනලදස්ථානයෙහි නොදැක කාරණාකිම්දෝහෝයි බලාවදාරා දිවැසින් මහමෙරපල්ලෙහි ධාතුකරඬුවගැල ඔත්නාවූ නාගරාජයා දකිමින් ඒ ක්ෂණයෙහි පතලාවූ පක්ෂපත්‍රයෙන්මහත්වූ ආකාශකුහරය වසන්නාක්වදවූ ගුරුළුවේසයක්මවාගෙණ තමාගේපක්ෂපත්‍රයෙන්උපන් බලවත්වූ පවනින්අතිගම්භීරවූ සාගරජලය දෙබෙකරමින් භයඞ්කාරවූ සාරම්භවේගයෙන් වහාදිවෙමින් මහාමේරුපර්වතය පල්ලෙහි හොත්තාවූ නාගරාජයාවිසින්හරණලද නාගවේශයඇතිව භයින්චකිතවූ චිත්තසන්තානඇතිව දරණයහතුළුවාගෙණ ඒඇසිල්ලෙහිමතෙරුන්වහන්සේගේ පාමුලට එලඹසිටි නාගරාජයාහට ඒමහතෙරුන්වහන්සේවිසින් දන්තධාතූන්වහන්සේදෙවයි ඉල්වූකල්හී නාගරාජයාකියන්නේ

සකලජන හිතත්ථං යෙවජායන්ති බුද්ධා
භවභිජන හිතත්ථං ධාතුමත්තස්ස පූජා,
අහමපිජින ධාතුං පූජයිත්වා මහග්ඝං
කුසලඵල මනප්පං සඤ්චිනිස්සන්තිගණ්හිං.

යනුහෙයින්සර්වඥපුත්‍රවූ උත්තමයානන්වහන්ස සර්වඥවරයෝනම් සියළු ජනයන්ට හිතප්‍රධානකොටඋපදිති එසේවූසර්වඥවරයන්ගේ සර්ෂපප්‍රමාණවූත් ධාතුමාත්‍රයකට එක්මලක් එක්පහනක් විවරකිනුත්කරණලදපූජායෙන් ජනයාහටහිතසැප පිණිසවන්නේමය එසේහෙයින්මමද මාහැඟිවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේගේ ශ්‍රී දන්තධාතුන්වහන්සේට පූජා සත්කාරකොටබොහෝවූ කුසලඵලරැස්කොටගණිමියිකීකල්හි ඒනාරජුට

---

*පණ්ඩුහාර, යනු, දාඨාවංශයෙහි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

වදුරණසේක් සත්‍යාවබොධයටසුදුසුවූ මනුෂ්‍යයන්ටවාසස්ථානවූ සිංහළ වීපයට මේ ධාතූන්වහන්සේඅපවිසින් ගෙණයනලදැයිකියා නාරජනුඅතින් ඒදළදාකරඬුව ලත්කල්හි ඒතෙරුන්වහන්සේගුරුළුවේශයහැර සඬයා විසින් බියපත්වූ සාගරයෙන්ගොඩනැගී සියළු පෘථිවිතෙලෙහි එකරජ කරණලද රාජ්‍යශ්‍රියමෙන් දළදාවහන්සේ ඔවුන්දෙදෙනාට ගෙණවුත් පාවාදුන්කල්හි ඒතෙරුන්වහන්සේගෙන්ලබනලද දන්තධාතූන්වහන්සේ තමන්සියමුදුනේතබාගෙණ යනකල්හි අඬානමාර්ගයෙහි කටුආදිය පහව නිර්මලවසුදුවැල්ලෙන් මනොඥවූයේ දෙවතාවන් විසින් පුදන ලද්දාවූ සුගන්ධ කුසුමාදීයෙන්ද පූජාලැබ තමලිංගමු නුවරට වන් කල්හි ඒ නුවර වැසියන්ගෙන් ලබනලද පූජාසත්කාරයෙන් යුක්තව ඒ තාම්‍රලිඞග දෙශයෙහි වෙළඳුන් විසින් සරහා පිළියෙලකරණලද්දාවූ නාවුකාවක් දැක ඒනාවුකාව සම්පයට ගොස් එහි නියුක්ත ජනයන්ට සවණට මිහිරිවූ නෙපුල් කියමින් ඒ ඇසූ වෙළඳුන් විසින් සතුටු සිත් ඇතිව ඔවුන් දෙදෙනා නැවට නැන්වූ කල්හි ඒ දළදා වහන්සේගේ ආනුභාවයෙන් රළපතර සන්සිඳුනේය උතුරු දිගින් හමන ලද පවන දක්ෂිණ දිශාවට හමන්නේය සර්වප්‍රකාරයෙන් නිල්වූ සොභා ඇති ආකාශයෙහි ගමන්ගත් ගරුඩරාජයක්හු මෙන් බලවත්වූ මාරුත වෙගයෙන් දීවන ලද නාවුකාව තෙම ඇස් හමුයෙහි බලබලා සිටියදීම ඉක්මෙනලද පර්වත ඇතිව පෙනනමැති මලින් යුක්තව සාගරමධ්‍යයට වන් කල්හි ඉක්බිත්තෙන් භයඞ්කාරවූ සංවට්ටප්‍රලය මාරුතයෙන් පහරණලද පර්වතකූටහා සමානවූ රළපතරින් කන්පලන්නාක්හු මෙන් භයඞ්කාරවූනාදයෙන් වලකනලද අවකාශ ඇතිකල්හි භයින් භයපත්වූ හැඞිම් ඇතිව ඒ සියලු රාත්‍රිය ඉකුත්ව පහන්ව ගියකල්හි ඒ සාගරයෙහි සන්හුන් රළපතර ඇතිව ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ ගලතලක්මෙන් සොභාමත්වූ කල්හි සමුද්‍රයෙහි දිව්‍ය නාගින් විසින් ශ්‍රීදන්තධාතූන් වහන්සේට පූජා පිණිස සිය දහස් ගණන් පෙණ මවමින් සමහරකෙණෙක් දිව්‍යමයවූ ශරීර මවා ගෙණ ඇවිදිනාහ සමහර කෙණෙක් හස්තයෙන් ගන්නාලද කඩුපුල් මලින් යුක්තවද සමහරකෙණෙක් සවර්ණකුම්භ රජතකුම්භ ගණිමින් යුක්තවද සමහරකෙනෙක් ධජපතාකගන්නාහුද සමහරකෙනෙක් රන් වැට රිදීවැට ආදිවූ පහන්වැට ගණි මින් ඇවිදිනාහුද සමහර කෙනෙක් මනොඥ නෘත්‍යගීතවාද්‍යප්‍රසඞ්ගයෙන් යුක්තව සමුද්‍රමධ්‍යයෙහි පූජාවට පටන්ගත් කල්හි රජකන්‍යාව විසින් නාවුකාවට නැගෙන්නට පූර්වභාගයෙහි මනොඥවූ තමාගේ ධම්මිල්ල කලාපයෙහි බහා සංග්‍රහ කළ ඒ ශ්‍රී දන්තධාතූන්වහන්සේට නාගින් විසින් පූජොත්සව කරණ වේලෙහි නිල් මේඝකුලක්මැදින් පැනනැගිචන්ද්‍රරේඛාවක්මෙන් ආකාශකුහරයට පැන නැගී රශ්මිමාලාවන්විහිදුවමින් නාගින්ගේසිත්සතුටුවූකල්හි කරණලද

පූජාඝෝෂායෙන්ද දෙනලදසාධුකාරනාදයෙන්ද ආකාශකුහරය නොසෑහෙන්නාක්මෙන්දවිය නැවත ඒදළදාධාතූන්වහන්සේ කියනලද උපමා ඇති ධම්මිල්ලකලාපාන්තර්ගතව වැඩඋන්කල්හි ඒ පූජාපිණ්ඩ ආවාවූ නාගින්විසින් නාවුකාව රාත්‍රිදිනයෙහි සත්දවසක්මුළුල්ලෙහි සමුද්‍රමධ්‍යයෙහිරඳවාගෙණ පූජාකළකල්හි ඒනාවුකාව නිශ්චලවූවිමානයක්මෙන් සාගරමධ්‍යයෙහි ගමන්නැතිවූකල්හි ඒජයම්පතින්විසින් ඒඛෙමනාම්තෙරුන්වහන්සේ සිහිකළක්‍ෂණයෙහි දිවකනින්අසා එසඳ ඔවුන්ලඟටඅවුත් අභිප්‍රාදූන ආකාශයෙහි නිල්වූවලාකුළුමඩිමින්ගොස් මහත්වූ ගුරුළුවේශයක්මවාගෙණ ඒක්‍ෂණයෙහි ඒනාගින්තැතිගන්වා යැවූකල්හි—

ඉත්ථං බුද්ධසුතෙ භුජඞ්ග ජනිතං භීතිං සමෙත්වා ගතෙ
සානාවා පවනා.පකම්පිත ධජා තුඞ්ගං තරඞ්ගා වලිං,
භින්දන්තී ගති වෙගසා පුථුතරං මෙඝාවලි සන්නිභං
ලඞ්කා පට්ටනමොතරිත්ථ සහසා ථෙරස්ස තස්සිද්ධියා.

යනුහෙයින් මෙසේ ඒ සම්ඥපුත්‍රවූ තෙරුන්වහන්සේ නාගින් විසින් උපදවනලද භය සන්සිඳුවා පවනින් කම්පිතවූ ධජපතාක ආදිය සහිතවූ ඒ නාවුකාව සුලං වේගයෙන් උස්වූ රළපතර බිඳිමින් සියලු ගුණ ගනාඞගයෙන් උපලක්‍ෂිතවූ ඒ තෙරුන්වහන්සේගේ සෘද්ධ්‍යානුභාවයෙන් වහාම කිත්සිරිමෙවන් රජහුගේ නවවන්නෙහි ලඞ්කාපටුන් බැස ඔහු දෙදෙනා ඒ ලක්දිව් පටුන සමීපයෙහි දෙවාලයකට බැස ඒ ස්ථානයෙහි ලැග පහන්වූ දවස් එනනින් නික්ම ක්‍රමයෙන් දුරු කතර ගෙවා—

අනුරාධ පුරං රම්මං ආසි ලඞ්කා මහීතලෙ,
භූමි කාමිනියා සාධු මණ්ඩිතං වදනං විය.

භොගින්ද එන භොගෙහි පරිතොව පරික්ඛිතං,
සුධාය ධවලුත්තුඞ්ග පාකාරට්ටාලමණ්ඩිතං.

සුරාසුර නරාදීහි මහ මානෙහි සබ්බදා,
කෙලාස සිඛරුත්තුඞ්ග ථූපාලීහි මනොරමං.

ඉච්ඡිතත්ථප්පදානෙන සුරපාදප සන්නිභෙ,
නාණී නත්ථාහි පූජේනාහි බොධිපාදප මණ්ඩිතං.

නෙක භික්ඛු සහස්සෙහි භික්ඛුනීහි තථෙව ච,
සමාකිණ්ණ මනොහාර විහාර සත මණ්ඩිතං.

වි භූමකාදි උත්තුඞ්ග හෙමථූපික සුන්දරං,
නවලක්ඛමිතාකිණ්ණ පාසාදෙහි සුමණ්ඩිතං.
ඝටදීපධජාදීහි නානා තොරණ පන්තිහි,
චන්දවඞ්කාදි නෙකෙහි වීථිමාලා සමාකුලං.

ගජානං කුඤ්ජනාදෙන හයානං හෙසිතෙන ච,
භෙරි නාදෙහි නෙකෙහි එකනිග්ඝොස ඝොසිතං,

භෙරිමණ්ඩල මජ්ඣේ නාටිකා සමලඞ්කතං,
තත්ථතත්ථ ජනාකිණ්ණනාච්චමණ්ඩල මණ්ඩිතං.

අනෙක විභවාකිණ්ණ නරනාරීහි සෙවිතං,
දෙවාන මාලකං වාපි මනො නන්දන මාවහන්ති.

යනුහෙයින් උරගෙන්ද්‍රයෙකුගේ දරණවැල පඞ්ක්තියක් මැනිවූ හාත් පසින් වටකරණලද අතිසයින් ධවලව උස්වූ ප්‍රාකාර ගොපුරට්ටාල පඞ්ක්තියෙන්ද සියලු දිව්‍යමනුෂ්‍යාදීන්විසින් නිරන්තරයෙන් කරණලදපූජා සත්කාරඇති කෛලාසකූටශිඛරයසේ අතිසයින් උස්ව සිත්කළුවූ දාගැබ් පඞ්ක්තීන් විරාජමානවූ සියලුජනයන් විසින් වැඳපුදන ලදලොකවාසීවූ සත්වයාහට ඓහලෞකික පාරලෞකික සම්පත්ප්‍රදානයකරණහෙයින් ගැවසීගත් කල්පද්‍රැම පඞ්ක්තියක් හා සාදෘශ්‍යවූ ඒඒ ස්ථානයෙහි පිහිටියාවූ බොධිද්‍රැම පඞ්ක්තියෙන්ද තවද නොයෙක් දහස්ගණන් භික්ෂුභික්ෂුණීන් විසින් ආකීර්ණවීමෙන් මනොහරවූ ආරාම සියගණනින් ප්‍රතිමණ්ඩිතවූ ඒ අනුරාධ පුරනම් නුවර උඩුමාල් නවලක්ෂයක්හා බිම් මාල් අනූලක්ෂයකින් සැදුනාවූ ද්විභූමික ත්‍රිභූමික යනාදිවූ ප්‍රාසාද සමූහයන්ගේ මස්තකයෙහි බහා පැලඳවූ රන්කොත් සමූහයෙන් ප්‍රතිමණ්ඩිතවූ සවර්ණරජත ඝටආදිවූ ඝට පඞ්ක්තියෙන්ද මෙසේම නානා ස්ථානයෙහි විරාජිත ප්‍රදීප මාලායෙන්ද අනෙක වර්ණ කොට නගනලද ධජපඞ්ක්තියෙන්ද මෙසේම රන්තොරණ රිදී තොරණ පිළිතොරණ රඹතොරණ යනාදිවූ තොරණ පඞ්ක්තියෙන්ද චන්ද්‍රවඞ්ක වීථිය මහවැලිවීථිය සිඟුරුවක් වීථිය ආදිවූ වීථිපඞ්ක්තියෙන්ද සොභමානවූ එහි ඇත්අස් සමූහයාගේ කුඤ්ච නාද හෙෂාරවයෙන් එකනින් නාදවූ නිරතුරුව වයනලද භෙරිතූර්‍ය්‍ය ශබ්දනාදයෙන් නිඝෝෂවූ තන්හි තන්හි රඟමඩුලු බැඳ නෘත්‍යගීතවාද්‍යදියෙහි දක්ෂවූ නලුනාටිකාවන් විසින් සමලඞ්කෘත වූ නොයෙක් ශ්‍රී සම්පත්තියෙන් ආකීර්ණවූ ස්ත්‍රීපුරුෂයන් විසින් ගැවසීගත්තාවූ දෙවියන්ගේ ආලකමන්දානම් රාජධානියට අපහාස්‍යකරන්නාක්බඳුවූ සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට සන්තොෂ එළවන්නාවූ මේ ශ්‍රී ලඞ්කාද්වීපනැමති අඞ්ගනාව සරහා පිළියෙලකරණ ලද්දාවූ මුඛමණ්ඩලයක් බඳුවූ ඒ අනුරාධ පුරප්‍රවරය සමීපයෙහිවූ මේඝ ගිරිනම් විහාරයට ඔහුදෙදෙනා අවුත් තෙරුන් වහන්සේ දැක දළදාවහන්සේ වඩාගෙණ ආ පවත් කී සඳ ඒ තෙරුන් වහන්සේ සන්තොෂයෙන් අමෘතාභිෂේක කරණලද ශරීරඇත්තාක්හු මෙන් සතුටුසිතින්පිනා ඒක්ෂණයෙහි සැතපෙනලදගෙහි පටකඩ වියන් බැඳ සරසනලදආසනඇතිව තිබ්බාලවූ ශ්‍රීදන්තධාතූන්වහන්සේවඩා ඉක්

භිහිව ලැනකෙනෙකුන්වහන්සේහා සෙසු භික්ෂූන්වහන්සේ ශ්‍රී දන්ත ධාතුන්වහන්සේ වඩාගෙණ ආපවත් රජ්ජුරුවන්ට කිවමැනවැයි යැවූ කල්හි සියළුසිව්රඟසෙනඟපිරිවරා උද්‍යානක්‍රීඩාවටගිය රජුකරගොස් එ පවත් කීකල්හි ඒරජසතුටුව නක්‍ෂත්‍රපාඨකයන්විසින් කියනලද නිමිත්ත සරියසිතියමින් ඒස්ථානයෙහිසිට විහාරයට අවුත් එපවත්අසමින් චක්‍ර රත්නයක් හස්තගතවූ සක්විති රජකුනු මෙන් බොහෝ සමාධියට පැමිණ ඒ කිත්තිසිරිමේඝ රාජෝත්තම තෙම පිටකත්‍රය ධාරිවූ භික්ෂුසංඝයා රැස්කරවා අප ශ්‍රී දන්තධාතුන්වහන්සේ දක සර්වඥයන්වහන්සේගේ දන්ත ධාතුනම් සුසුතාකද්‍යස්ථායයි ධර්මයෙන් ඇසීම් මුන්වහන්සේ වනාහි මලිනභාවඇතිසේකැයි කාංශාඉපදවූකල්හි—

තස්මිං ඛණෙ දසනධාතු මුනිස්සරස්ස
පක්ඛෙ පසාරිය දුවෙ වියරාජහංසී,
විප්ඵාරිතං සුනිවහා ගගනඞ්ගනම්හි
ආවට්ටතො ජවි ජවෙන මුහුත්තමත්තං.

යනාදීන් කියනලද ශ්‍රීදන්තධාතුන්වහන්සේ ඒ ඇසිල්ලෙහි පක්‍ෂපත්‍ර දෙක විදහා ගමන් ගත් රාජහංශයෙකු මෙන් පතුරුවනලද රශ්මිසමූහ යෙන් ආකාශාඞ්ගණයෙහි මද ඇසිල්ලක් ශීඝ්‍රගතියකින් දක්ෂිණාවෘත්ත කොට දිවෙමින් ප්‍රාතිහාර්ය්‍ය කොට කිත්තිසිරිමේඝ රජහු සමාධියට පැමි ණවූ කල්හි ඒරජහු විසින් මාහැඟිවූ භද්‍රාසනමස්තකයෙහි දළදාධාතුන් වහන්සේ වඩා ශරත්කාලයෙහි වලාකුලක් හා සමානවූ සොභා ඇති දූසමන් මල් ගොඩකින් වසා පූජාකළකල්හි ඒ මල් ගොඩ පලාගෙණ උඩනැගී මුදුනෙහි පිහිටා ක්ෂීරපටලයක් මෙන් අතිධවල රශ්මියෙන් බලන්නාවූන්ගේ නෙත්‍රයන් ඇසිපිය නොහෙලන පරිද්දෙන් අද්භූතවූ ප්‍රාතිහාර්ය්‍ය දක්වූකල්හි–තවද ඒ කිත්තිසිරිමේඝ රජහු විසින් ශ්‍රී දන්තධා තුන්වහන්සේ තමන් විමසනු පිණිස ආසනයෙහි පිහිටි ක්ෂීරපටලයක් හා සමානවූ ධවලවූ අනර්ඝ වස්ත්‍රයකින් වසා ආසනයෙහි පිහිටුවා මාහැඟි පිළි සියගණනින් වැසූකල්හි ඒ දළදාවහන්සේ හෙලවලාකුලකින් වසන ලද සඳක් සෙයින් ඒ ක්ෂණයෙහි සියගණන් වස්ත්‍රයන් පලාගෙණ උඩට පැනනැගී ඒ වස්ත්‍රයන්ගේ මුදුනෙහි පිහිටා කොඳ කැකුළු සේ සුදුවූ රශ්මීන් දශදිගුන් බබුළුවමින් ප්‍රාතිහාර්ය්‍ය පෑ කල්හි ඒ ඇසිල්ලෙහි මෙරු යුගන්ධර පර්වතයන් හා එක්ව සාධුකාර දෙන්නියක මෙන් පෘථිවිය ගර්ජනාකොට සියළු සාගරය රළනමැති හස්තයන් ඔසවා ආශ්චර්ය්‍ය බලන් නාක් මෙන් නිශ්චලවූ කල්හි හස්තීන් විසින් කරණලද කුඤ්චනාදද ආකාශකුහරයෙන් වස්නාවූ මල් වරුෂාද නොයෙක් දෙවියන් සහිත දිව්‍යස්ත්‍රීන් විසින් නටනලදනානා ගීතයෙන් සියළු සත්ත්වයන්ට ආශ්චර්ය්‍ය

දක්වූකල්හි–එරණ ප්‍රීතීන් පිනා නවවිධවූ රත්නයෙන් පූජාකෙරෙමින් තමාගේ සියමුඳුනෙන් ශ්‍රීදන්තධාතූන්වහන්සේ වඩාගෙණ නගනලද සොවනච්ඡත්‍රයන් ඇති ඇලිඅසුන් යෙදූ මඟුල්රථයෙහි නැගී–

සමලඞ්කතං පුණ්ණඝටං නානාරාග ධජං සුභං,
පාතිං චන්දන චුණ්ණඤ්ච දීපධූප කටච්ඡුකං.

යනුහෙයින් සරහාපිළියෙළකරණලද පූර්ණඝටපඞ්ක්තියෙන්ද නානා වර්ණයෙන් නන්වනලද ධජපඞ්ක්තියෙන්ද වස්වනලද්දාවූ සඳුන් සුණු ආදී සුවඳසුණු ආදියෙන්ද මෙසේම ලනලද සුවඳ සුඹුළු සුණුපඞ්ක්තියෙන්ද යුක්තවූ මෙසේම කොඩ පලස් අදියෙන් විචිත්‍රකොට සරහා නිමවනලද ආස්තරණාදීන් අතුට සැරහු ආසනමස්තකයෙහි නගනලද ධවලාතපත්‍රයෙන් විරාජමානවූ සිංහාසනමස්තකයෙහි ශ්‍රීදන්තධාතූන්වහන්සේ වඩා රාජ්‍යයෙන් පූජා කොට දන්තකුමාරයන් හා හෙමමාලාවන් දෙදෙනාට බොහෝ වස්තු දී තමන්හා සමානස්ථානයට තබා නවද අනගි රන්රුවන් ආදිවූ නවලක්‍ෂයක් ධනවියදම්කොට ත්‍රිසිංහලෙශ්වරවූ ඒ කීර්ත්තිශ්‍රීමේඝ මහාරාජෝත්තමයානන් විසින් රාත්‍රිඤ්දිනයෙහි අනලස්වූ සිතින් කරණලද පූජාසත්කාරයෙන් රැස්කරණලද පුණ්‍යසම්භාරයාන් ඇතිව ඒ රජ ත්‍රයත්ත්‍රිංශත් භවනයෙහි ඉපිද දිව්‍යස්ත්‍රීන් හා සමග දිව්‍ය රාජ්‍යශ්‍රීසම්පත් අනුභව කරණකල්හි–නවද සුළුවස මැනභාගයෙහි රජ පැමිණි රජදරුවන් විසින් තමතමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් බොහෝවූ පූජාසත්කාර පවත්වමින් දවස් යැවූ කල්හි සොලින් සිංහලද්වීපයට බැස යුධ කොට බොහෝ කලක් මෙහි වැස දළදා පාත්‍රධාතූන්වහන්සේ හා මිණිබෙර ශ්‍රීලඞ්කාද්වීපයෙන් ඇරගෙණ සොලිපුරයට ගෙණගොස් එහි දීර්ඝකාලයක් අතික්‍රම්‍යව ශ්‍රීලඞ්කාද්වීපයෙහි උපන් සිළුසිරිසඟබෝ නම් රජෙක් අභිෂේකප්‍රාප්තව සොලින් විසින් ගෙණයනලද දළදා පාත්‍රාධාතූන්වහන්සේහා මිණිබෙර ත්‍රිසිංහලයෙහි සේනාව මාවවූවට රැස්කරවමින් මර සෙනෙවි රඳුන් හා සමග මහබලසේනාව සොලිරටට යවා සොලින් හා යුධ කොට දළදා පාත්‍රාධාතූන්වහසේ හා මිණිබෙර ලඞ්කාවට වඩාගෙණවුත් ඒරජහු විසිනුත් දිවිපමණින් බොහෝ පූජාසත්කාර පවත්වා ඔහු අවසන්වූ කල්හි–නවද මෙම ලඞ්කාවෙහි රජපැමිනි ගජබාහු නම් රජෙක් එසේම සොලින් ගෙණගිය දළදාපාත්‍රාධාතූන්වහන්සේ තමාගේ බාහුබලවික්‍රමයෙන් ඔවුන් හා යුධ කොට ඇරගෙණ ලඞ්කාවට බැස දළදාපාත්‍රාධාතූන්වහන්සේ විෂයෙහි පූජාසත්කාර කිරීමෙන් බොහෝකාලයක් කුසලසම්භාරයන් රැස්කොට ඉකුත්වූ කල්හි–නවද ශ්‍රීලඞ්කාද්වීපයෙහි ශ්‍රීමහාබොධීන්වහන්සේ වඩා ආ රජපරපුරෙන් මහලේවැස රජපැමිණි මහළු විජයබාහු නම් රජද දෙමළුන් හා යුධකොට ලඞ්කාද්වීපය තනාගෙණ රාජ්‍යශ්‍රීන් අනුභව කෙරෙමින් බොහෝ ශාසනාභිවෘද්ධි

සඳ කරමින් කඳයුරෙහි පොරන දළදාගෙය කරවා දාඨාධාතූන්වහන්සේද එහි වඩා පහුත කුසලසම්භාරයන් රැස්කොට ඔහු පරවිවිලියවූ කල්හී–

සොත්ථිප්පසත්ථ විවිධාපණ සංකුලම්හා
ලඞ්කාවධූ තිලකභූත සිරීධරම්හා,
විචාලිසඞ්ඝමුප සෙවිත පඞ්කජම්හා
ලොකොද්දිතුත්තමපුලත්ථි මහාපුරම්හා.

යනාදීන් වර්ණිතියවූ පොලොන්නරුනම් පුරයෙහි රජපැමිනි මහළු පරාක්‍රමබාහු නම් රජද–ශ්‍රී විමල මලය දෙශාභිජාත ජම්බුද්‍රොනිපුර නම් නුවර කලිකාල සර්වඥයන උදාර විරිදු බණවනුක්ෂත්‍රිය පරිසදින් ගැවසී ගත් කීර්තිශ්‍රී මෙඝ රජහු නිසා රූපලාවණ්‍ය ගුණොපෙත අසම්භින්නක්ෂත්‍රියවංශාභිජාත රත්නවල්ලී නම් බිසවකුස පිළිසිඳ දසඑකඩමසින් බිහිව ශුක්ලපක්ෂාභිවර්ධමාන චන්ද්‍රමණ්ඩලානුකාරයෙන් ක්‍රමාභිවෘද්ධිව ෂොඩශ වර්ෂ ප්‍රාප්තව නොයෙක් ශිල්පශාස්ත්‍රයෙහි දක්ෂයන් විසින් උගන්වනලද ශිල්ප ඇතිව පියරජහු විසින් ලබනලද සමුඇතිව–පරරාජ ගොධූම සඞ්ඝට්ටන උද්ධත රාජනිර්මූල දුර්ලලිබ්ධි මර්ථනය දූර්නිනිවාරණ පරකෘතඥ සකලදිග් විජය අනන්ත ස්මර ශත්‍රු විජය සරණාගත වජ්‍රපඤ්ජර පරමන්ත්‍රප්‍රභෙද වික්‍රමප්‍රතාප අකලඞ්ක සර්ව ශාස්ත්‍ර සිරොමාණික්‍ය කෘතාභනු කෘත්‍යය යනාදිවූ සියගණන් විරිදු බණවමින් ජානකුලයෙන් නික්ම පිහිටි රජයෙහි පොලොන්නරුනම් නුවර උපන් ගජබාහුනම් දේවයන්ද රොහණ ජනපදයෙහි උපන් මාණාභරණ දෙවයන්ද ඇතුළුවූ තුන්සිය සැටක් මන්නිපත්තු සාධා සමන්තකූට පර්වතරාජයාහට මුක්තාහාරශ්‍රී ධරන්නාක්බඳුවූ ශරදභ්‍රසුභ්‍රශඞ්ඛඥ කුමුද ධවල චන්ද්‍රභාපුඤ්ජසන්නිභ පරම සුවිසුද්ධ වාළුකානලයෙන් ගැවසී ගත් මහවැලිගඟට නුදුරුවූ පූර්ව නාරෙන්ද්‍රයන්ට වාසස්ථානවූ පුලත්ථ්‍යාභිධාන නම්වූ නුවරෙහි ඉපද ත්‍රිසිංහලයට එකච්ඡත්‍රනත්වා අභිෂෙකප්‍රාප්තවූ සත්වෙනි අවුරුද්දෙහි තමන් හා සමානච්ඡත්‍රවූ පිරිවතුගුණමහලැනත්ගා චතුරංගිනි සේනාව යවා රුහුණු උදුම්බර අමරගිරි පර්වත සමීපයෙහි සුරක්ෂිතකොට වසාතුබූ දළදා පාත්‍රාධාතූන්වහන්සේ වඩා ගෙන්වාගෙණ අඛණ්ඩ ලක්ෂ්මී නිවාසවන නරම් ධාතුමණ්ඩිරයක්කරවා එහි විසිතුරුවූ සිංහාසනයක් කරවා සමුස්සිත ධවලාතපත්‍ර විරාජිත ඒ සිංහාසන මස්තකයෙහි ශ්‍රීදන්තධාතූන්වහන්සේ වඩා ලඞ්කාවිපයෙහි දළදාමළුවයයි යන නමින් ප්‍රසිද්ධ කොට බොහෝ පූජාසත්කාර පැවැත්වූහ–නවද උදුම්බර ගිරි නිවාසිත මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛ බහුල භික්ෂුසඞ්ඝයාට උපස්ථම්භ කොට වලගම් අබා මහරජහු පටන් එක්වාදහස් දෙසිය සිවුපණස් අවුරුද්දක් භින්නනිකායගතව වෛතුල්‍ය වාදිය, සාගලීය වාදිය, ධර්මරුචිවාදීය යන වාදත්‍රයගෙණ භින්නවූ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

රජතෙනාද තමන්ගේ විභවානු රූපයෙන් ප්‍රසිද්ධව ත්‍රි සිංහලද්වීපයෙහි අසහාය ඡත්‍ර නන්වා සමස්ථයෙන් රාජ්‍යශ්‍රී අනුභවකරන්නාහු ශාසනයෙහි බොහෝ භික්ෂූන්වහන්සේට චතුර්විධ ප්‍රත්‍යාදීන් උපස්ථානකරවා මහණ මහළුපැවිදි කරවා ශාසනොපස්ථම්භව—නවද පන්සියපණස්ජාතකආදිවූ සද්ධර්මයද තෙවරෙක අසා ඒ ඇසූ පාලිධර්මය ස්වභාෂාවෙන් ලියවා නවද චාදසරතන ප්‍රමාණවූ බුද්ධරූපයද කරවා බහුවිධ වස්ත්‍ර පරිත්‍යාග කොට කඨිනචීවර අදිවූ අෂ්ටපරිස්කාර දවස්පතා දෙමින් නවද ඒ ශ්‍රී දන්තධාතූන්වහන්සේට සත්දහසකින් රජතකරණ්ඩකයක්කරවා ශ්‍රීදන්ත ධාතූන්වහන්සේ එහි වඩා විසිතුරුවූ පූජෝත්සව පවත්වා අවුරුද්දෙනිද කාර්තිකයෙහිද ශ්‍රීදන්තධාතූන්වහන්සේට සියයට .කාල අගයේ නව නොවින් පඩුරුපූජාද සලස්වා බොහෝ කුසලසම්භාරයන් රැස්කොට ස්වර්ගමොක්ෂසම්පත් සාදන්නාවූ ඒ රාජොත්තමයා විසින්ද යටකියනලද බොහෝ රජදරුවන් විසින් කරවූ සුචරිතය මෙන් මේ දළදාපූජා පිළිවෙළින් අසා දන-දනුදු එනදවසද සිරිලකපැමිණි රජරාජ මහාමාත්‍යාදීන් විසින් ශුද්ධාබුද්ධි සම්පූර්ණව දෙලොවින් හිතසැපත් සාදාදෙන්නාවූ මේ සුචරිත සතුවූ සිහින් පැවැත්විය යුතු.

රාජධම්මමකොපෙන්තා රඤ්ජයන්තා මහාජනං,
රාජානොපි චිරං සම්මා පාලයන්තු වසුන්ධරං.

දළදාපූජාවලිය නිමි.